සැ. යු.- 2014.01.24 දින පළ වූ අංක 1,847 දරන ගැසට් පත්‍රයේ I:III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,848 - 2014 ජනවාරි මස 31 වැනි සිකුරාදා - 2014.01.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 142 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 151 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 පෙබරවාරි මස 21 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 පෙබරවාරි මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

පී. එච්. එල්. ඩී. ද සිල්වා,
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

139- B 80807—2,985 (2014/01)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාව

ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු

ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ පහත සඳහන් වෘත්තීන්ට අදාළව ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු පවතී. :-

1. (*අ*) වෘත්තීන් සහ අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

(1) ගුවන් යානා ඉංජිනේරු වෘත්තීන්

(*අ*) ගුවන් යානා සැකිලි ශිල්පී (පිරිමි)
(*ආ*) ගුවන් යානා යන්ත්‍ර ශිල්පී (පිරිමි)
(*ඇ*) ගුවන් යානා විදුලි සහ මෙවලම් ශිල්පී (පිරිමි)

සිංහල/දෙමළ, ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද ඉන් ගණිතය හෝ විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(2) *සාමාන්‍ය ඉංජිනේරු වෘත්තීන්*

(*අ*) අවි ආයුධ ශිල්පී (පිරිමි)
(*ආ*) රථවාහන කාර්මික ශිල්පී (පිරිමි)
(*ඇ*) ගුවන්යානා ගිනියම් පෑස්සුම්කරු (පිරිමි)
(*ඈ*) මතුපිට කාර්මික ශිල්පී (පිරිමි)
(*ඉ*) සාමාන්‍ය යාන්ත්‍රික ශිල්පී (පිරිමි)
(*ඊ*) ලෝහ තහඩු කාර්මික ශිල්පී (පිරිමි)
(*උ*) යාන්ත්‍රික වඩු කාර්මික ශිල්පී (පිරිමි)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය, විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ගණිතය/විද්‍යාව විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(3) *විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු වෘත්තීන්*

(*අ*) ගඟන ගුවන් විදුලි කාර්මික ශිල්පී (පිරිමි)
(*ආ*) විදුලි පණිවුඩ යන්ත්‍ර ශිල්පී (පිරිමි)

සිංහල/දෙමළ, ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද ඉන් ගණිතය හෝ විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(*ඇ*) දුරකථන ක්‍රියාකරු (පිරිමි)
(*ඈ*) පරිඝනක කාර්මික ශිල්පී (පිරිමි)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(4) *වෛද්‍ය වෘත්තීන්*

(*අ*) හෙද සහායක (පිරිමි/කාන්තා)
(*ආ*) දන්ත සහායක (පිරිමි)

සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව සහ වෙනත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් විද්‍යා විෂය ධාරාවෙන් ප්‍රධාන විෂයයන් තුනක් එක් වරක දී සමත්ව තිබීම සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ උසස් වෘත්තීය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකමක් ලෙස සැලකේ.

(5) *සැපයුම් වෘත්තීන්*

(*අ*) සැපයුම් සහායක (පිරිමි/කාන්තා)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් සහ ගණිතය/විද්‍යාව/ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. පරිඝනක පිළිබඳ දැනුම තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(*ආ*) සලාක සහකරු (පිරිමි)

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(6) *පරිපාලන වෘත්තීන්*

(*අ*) පරිපාලන සහායක (පිරිමි/කාන්තා)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය/විද්‍යාව/ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. පරිඝනක පිළිබඳ දැනුම තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(*ආ*) ගිණුම් සහායක (පිරිමි)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය/ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. පරිඝනක පිළිබඳ දැනුම තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(7) *මෙහෙයුම් වෘත්තීන්*

(*අ*) මෙහෙයුම් ගුවන් (පිරිමි)

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී

විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(ආ) මෙහෙයුම් භූමි (පිරිමි/කාන්තා)
(ඇ) සුනඛ පාලක (පිරිමි)

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(8) *පොලිස් වෘත්තීන් :*

(අ) පොලිස් (පිරිමි/කාන්තා)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. උස අඩි 5 අඟල් 8ට නොඅඩු පිරිමි හා අඩි 5 අඟල් 6ට නොඅඩු කාන්තා අයවළුන් හට බඳවා ගැනීමේ දී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

(9) *තූර්ය වාදක වෘත්තීන් :*

(අ) සංගීතඥ (පිරිමි)

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. වාදනය හා ගායනය පිළිබඳ මනා දැනුමක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(ආ) *අනෙකුත් සුදුසුකම්.*—ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් පහත සඳහන් පොදු කොන්දේසි සපුරාලිය යුතුයි. :

(අ) *පුරවැසිභාවය* : ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුයි;

(ආ) *වයස* : 2014 ජූලි මස 31 දිනට අවුරුදු 18ත් 23ත් අතර (පිරිමි)
2014 ජූලි මස 31 දිනට අවුරුදු 18ත් 22ත් අතර (කාන්තා);

(ඇ) *උස* : අඩි 5යි අඟල් 5කට නොඅඩු විය යුතුයි; (පිරිමි)
අඩි 5යි අඟල් 3කට නොඅඩු විය යුතුයි; (කාන්තා)

(ඈ) *බර* : 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 26 (පිරිමි)
17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25 (කාන්තා)

$$\text{ශරීර ස්කන්ධ දර්ශකය} = \frac{\text{බර (කි. ග්‍රෑ.)}}{\text{උස}^2\text{ (මී)}}$$

(ඉ) *වර්ණ දෘෂ්ටිය* : CP2

(ඊ) *දෘෂ්ටි තීක්ෂණත්වය* : වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (*උපැස් රහිත*)

(උ) *සිවිල් තත්ත්වය.*—අවිවාහක විය යුතුයි. (ගුවන් හමුදාවට බැඳී වසර දෙකක් ගතවන තුරු මෙන්ම මූලික වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා වසරක් ගතවන තුරුත් මෙම අවස්ථා දෙකෙහි පසුව එළඹෙන අවස්ථාවට අනුව විවාහ වීමට ගුවන් හටයින්ට/ගුවන් කාන්තාවන්ට අවසර දෙනු ලැබේ.)

2. පළමුවන ඡේදයෙහි 'අ' හි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ පළමුවන ඡේදයේ 'ආ' හි දක්වා ඇති අවශ්‍යතාවයන් හෝ සපුරා ගනු නොලබන අපේක්ෂකයින්/අපේක්ෂිකයින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, බර හා ඇස් පරීක්ෂා කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිම්වලට අනුව උස, බර හා ඇස් පෙනීම නොමැති අයදුම්කරුවන්/අයදුම්කාරියන් පළමු සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. එහෙත් ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් විශේෂ සුදුසුකම් ඇත්නම් ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය පරිදි ගුවන් හමුදාවට බඳවා ගැනීම පිළිබඳ සලකා බලනු ලැබේ.

3. ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ඨතා ලබා ඇතොත් ඒ ගැන නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

4. *සේවා කොන්දේසි :*

(අ) ගුවන් හටයින්/ගුවන් කාන්තාවන් සේවයට බැඳුනුදා සිට ගුවන් හමුදා පනතට, ගුවන් හමුදා රෙගුලාසිවලට සහ ගුවන් හමුදා අණපනත්වලට යටත් විය යුතුයි.

(ආ) තෝරාගනු ලබන සියලුම ගුවන්හටයින්ට/ගුවන් කාන්තාවන්ට මූලික සටන් පුහුණුවත් ඉන් පසුව වෘත්තීය පුහුණුවත් ලබා දෙන අතර ඔවුන් ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක, දිවා රාත්‍රී ඉතා දුෂ්කර තත්ත්වන්හි වුව ද, ඕනෑම ආකාරයක රාජකාරියක් තම මව් රට තුළ දී හෝ විදේශයක දී ඉටුකළ යුතුය.

5. *බඳවා ගැනීමේ කොන්දේසි :*

තෝරා ගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් නිත්‍ය ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ගුවන්හට/ගුවන් කාන්තා නිළයට ඇතුළත් කරනු ලබන අතර, ඔවුන් වසර 12ක සේවා කාලයකට යටත් විය යුතුයි. ඉන් වසර 08ක් අඛණ්ඩව සේවය කළ යුතු අතර, එම කාලය සීමාව නිමවීමෙන් පසු වසර 04ක් නිත්‍ය උප සේවයට (අපේක්ෂිත කණ්ඩායමේ) කැඳවීමක් කළ අවස්ථාවක දී වාර්තා කළ යුතුයි. අවුරුදු 08ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන්හටයින්ට/ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

6. *රාජ්‍ය භාෂාව පිළිබඳ නියමයන්.*—තෝරාගනු ලබන අපේක්ෂකයින් /අපේක්ෂිකාවන් ශ්‍රී ලංකාණ්ඩුවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියාකළ යුතුයි.

8. *වැටුප් හා දීමනා :*

(අ) වසරකට ගුවන් හටයින්ට අදළ ඒකාබද්ද වැටුප් පරිමාණ පහත සඳහන් පරිදි වේ :-

ගුවන්හට - රු. 1,73,100 - 6 x 1,740 - 19 x 2,040 = රු. 2,22,300 වාර්ෂිකව
නායක ගුවන්හට - රු. 1,78,320 - 4 x 1,740 - 19 x 2,040 = රු. 2,22,300 වාර්ෂිකව
කෝප්‍රල් - රු. 1,83,540 - 10 x 2,040 - 9 x 2,880 = රු. 2,29,860 වාර්ෂිකව
සැරයන් - රු. 187,620 - 3 x රු. 2,040 - 9 x රු. 2,880 - 3 x රු. 3,840 = රු. 2,31,180 වාර්ෂිකව
බලපත්ති සැරයන් - රු. 191,700 - 1 x රු. 2,040 x 9 x රු. 2,880 - 3 x රු. 3,840 = රු. 231,180 වාර්ෂිකව
බලලත් නිළධාරින් රු. 199,500 - 7 x 2,880 x 14 x 3,840 = රු. 273,420 වාර්ෂිකව
ප්‍රධාන බලලත් නිළධාරීන් රු. 2,23,500 - 13 x රු. 3,840 = රු. 2,73,420 වාර්ෂිකව

ඉහත දැක්වෙන පරිදි වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමාණයන්ට අනුව වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. ගුවන් හටයින්ගේ/ගුවන් කාන්තාවන්ගේ සේවා කාලය, යහපත් කල්ක්‍රියාව සහ කාර්යක්ෂමතාව මත ඉදිරි නිලයන් පිරිනමනු ලබන අතර, ඒ අනුව නියමිත වැටුප් දර්ශකයන්හි පිහිටවනු ලැබේ.

(ආ) දීමනා :

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 6,600 ක් ගෙවනු ලැබේ.

(2) දුෂ්කර දීමනා මසකට රු. 600 ක් ගෙවනු ලැබේ.

(3) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන්හට මසකට රු. 3,900 ක් ගෙවනු ලැබේ.

(4) විශේෂ දීමනාව I : මසකට රු. 2,400 ක් ගෙවනු ලැබේ. (රාජකාරි දිනකට රු. 80 බැගින්)

(5) විශේෂ දීමනාව II : 2013 මැයි මස ඒකාබද්ධ වැටුපෙන් 15% සහ රු. 375.00

(6) *දිරි දීමනා.*—සේවා කාලය වසර 5 සම්පූර්ණ කිරීමෙන් පසුව මෙම දීමනාව ගෙවනු ලැබේ. (මසකට රු. 250 සිට රු. 850 දක්වා).

(7) *ආහාර දීමනා.*—පිටත වාසය කරන ගුවන් හටයින්ට මසකට රු. 12,758.40 බැගින් ගෙවනු ලැබේ. කඳවුරු තුළ වාසය කරන ගුවන්හටයින්ට නොමිලේ ආහාර සපයනු ලැබේ.)

(8) *නිළ ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව.*—මසකට රු. 170 ක් ගෙවනු ලැබේ.

(9) අන්තර් දීමනාව : මසකට රු. 1,000 ක් ගෙවනු ලැබේ.

(10) *නේවාසික පහසුකම්.*—කඳවුර තුළ වාසය කරන ගුවන් හටයින්ට නොමිලේ සපයනු ලැබේ.

(11) *ගමනාගමනය.*—වසරකට නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් (03) (ගුවන් හටයා/භාර්යාාව සහ ළමයින්ට අදාළ පරිදි) දෙනු ලැබේ. ඊට අමතරව කඳවුර තුළ සිටින ගුවන් හටයින්ට/ගුවන් කාන්තාවන්ට මසකට එක් නිවාඩු බලපත්‍රයක් හෝ ලංගම බස් ගාස්තුව හෝ දෙනු ලැබේ.

(12) *වික්ෂේපණ දීමනා.*—මව් කඳවුරුවලින් වෙනත් ස්ථානයක රාජකාරි සඳහා යවනු ලැබූ විට මෙම දීමනාව ගෙවනු ලැබේ. (ගෙවීම් ප්‍රමාණය විවාහක/අවිවාහක බව අනුව වෙනස් වේ.)

(13) *සුදුසුකම් වැටුප්.*—ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් වූ විශේෂ පාඨමාලාවක් හදාරා ඇති හෝ විශේෂ සුදුසුකම් ඇති අයට මෙම දීමනාව ගෙවනු ලැබේ. (මසකට උපරිම රු. 637.50)

(14) *යහපත් කල්ක්‍රියා ලාංඡන දීමනා.*—මෙම දීමනාව ගෙවනු ලබන්නේ තම හැසිරීම හා සාමාන්‍ය විනය ඉතා උසස් අන්දමින් පවත්වාගෙන යනු ලබන තැනැත්තන්ටය. (මසකට රු. 30 සිට රු. 204 දක්වා)

(15) *නැවත සේවයට බැඳීමේ වැටුප්.*—නැවත සේවයට බැඳෙන ගුවන් හටයන්ට මසකට රු. 300 බැගින් දීමනාවකට හිමිකම් ලැබේ.

(16) *වෛද්‍ය පහසුකම්.*—ගුවන් හමුදාව මඟින් සෑම ගුවන් හටයකුටම/ගුවන් කාන්තාවකටම නොමිලේ වෛද්‍ය පහසුකම් සපයන අතර විවාහක නම් ඔහුගේ/ඇයගේ පවුලේ අයට නොමිලේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(17) කඳවුරුවල සිට සැතපුම් 30ක (කි. මී. 48ක) අරයක් තුළ පදිංචි කඳවුරෙන් පිටත වාසය කරන ගුවන් හටයන්/ගුවන් කාන්තාවන් සඳහා තම වාසස්ථානයේ සිට කඳවුරු වෙත ලංගම බස් මඟින් නොමිලේ ගමන් කිරීම සඳහා නිදහස් ගමන් බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

(18) රජයේ නිවාසයට වාසය නොකරන විවාහක ගුවන් හටයින්ට/ගුවන් කාන්තාවකටම මසකට රු. 1,200 සිට රු. 3,300 දක්වා ගෙවල් කුලී දීමනාවක් හිමිවේ.

(19) *උපදේශක දීමනාව.*—මසකට රු. 425 සිට රු. 510 දක්වා දීමනාවක් හිමිවේ.

(20) *වෙනත් දීමනා.*—(වෙන්ව සිටීමේ හා විදේශ ගතවීම් ආදිය) ශ්‍රී ලංකා ගුවන් හමුදා වැටුප් සංග්‍රහයට අනුව මෙම දීමනා ගෙවනු ලැබේ.

(21) වරින් වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයට අනුව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලු ගුවන් හටයින්/ගුවන් කාන්තාවක්ම දායක විය යුතුයි. අරමුදලට ගෙවිය යුතු දායක මුදල්වල අනුප්‍රමාණය 1970 වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදල් රෙගුලාසි අනුව වේ.

08. *අයදුම්කරුවන්ට උපදෙස් :*

(අ) පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව ඉල්ලුම්පත් සැකසිය යුතුයි. ඉල්ලුම්පතේ සියලුම හිස්තැන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් 2014 පෙබරවාරි මස 28 වැනි දින දහවල් 12.00ට පෙර ලැබෙනසේ "විධායක ආධුනිකයින් බඳවා ගැනීමේ නිළධාරි, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල, ඒකල, කොටුගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. (ලියාපදිංචි තැපෑලෙන් එවනු නොලබන අයදුම්පත් බාරගනු නොලැබේ). අයදුම්පතේ ඉහළ වම් කෙලවරේ "ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් හටයින්/ගුවන් කාන්තාවන් සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් කළයුතුයි. එක් අයදුම්කරුවෙක් එක් වෘත්තියකට පමණක් ඉල්ලුම් කළයුතු අතර, වෘත්තීන් කිහිපයකට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව කොටුගොඩ, ඒකල, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල වෙත ලැබුනා වූ ද, මේ නිවේදනයේ අවශ්‍යතාවලට අනුකූල නොවන්නා වූ ද ඉල්ලුම්පත් බාරගනු නොලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නිරත වුවන් ස්වකීය ඉල්ලුම්පත්, ඒ ඒ දෙපාර්තමේන්තු/ සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය. තව ද, යම් හෙයකින් එම ඉල්ලුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහු මුදවා හරිනු ලබන බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද ඒ සමඟ තිබිය යුතුයි.

(ඇ) සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන හෝ ඉල්ලා සිටින අවස්ථාවක අපේක්ෂක විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුයි. :—

(1) උප්පැන්න සහතිකයේ මුල් පිටපත (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය හා උප්පැන්න සහතිකයෙන් උපුටා ගත් සටහන භාරගනු නොලැබේ.)
(2) අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ඔප්පු කිරීමට සහතික,

(3) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික පුහුණුව හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික,

(4) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය,

(5) ක්‍රීඩා හා ශිෂ්‍ය භට යනාදිය පිළිබඳ සහතික.

(ඈ) නියම කරනු ලැබූ විට ලියකියවිලි ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

(ඉ) කිසිදු ලියකියවිලි හෝ සහතිකවල මුල් පිටපත් ඉල්ලුම්පත් සමග නොඑවිය යුතුයි.

(ඊ) ඉල්ලුම්පත් සමග සහතිකවල මුල් පිටපත් එවා, ඒවා නැතිවුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

09. සම්මුඛ පරීක්ෂණයට සුදුසුයැයි සලකනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ඔවුන්ගේම වියදමින් ගුවන් හමුදා බඳවා ගැනීමේ මණ්ඩලය ඉදිරියෙහි සම්මුඛ පරීක්ෂණයන්ට පෙනී සිටිය යුතු වේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන ස්ථානය, දිනය සහ වේලාව පෞද්ගලිකව දන්වනු ලැබේ.

10. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන්/අයදුම්කාරියන් කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම ඔහුගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි. ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් විසින් වෙනත් පිළිගනු ලැබූ අනන්‍යතා සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ වුවද ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් /අයදුම්කාරියන් සේවයට බඳවා ගනු නොලැබේ.

11. සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුසු වන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියෙහි පෙනී සිටිය යුතුයි. සම්මුඛ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණුවල අගය අනුව අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් ලැයිස්තු ගත කරන අතර, වෘත්තීය පුරප්පාඩු සඳහා අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් තෝරා ගනු ලබන්නේ ලබාගත් ලකුණුවල ඉහල මට්ටමේ සිටයි.

13. අයදුම්කරුවෙක්/අයදුම්කාරියක් නිර්දේශ කිරීමට කැමති ඕනෑම අයෙකු එසේ කළ යුත්තේ ඔහුට චරිත සහතිකයක් දීමෙනි. යම් අපේක්ෂකයෙක්/අපේක්ෂිකාවක් තෝරා ගැනීමට කවරාකාරයකින් හෝ පෙළඹවීමක් කිරීම, එසේ නැතහොත් එහිලා බලපෑමට උත්සාහ කිරීම ඔහුගේ අපේක්ෂකත්වය අවලංගුවීමට හේතු වන්නේ ය.

14. ඉල්ලුම් පත්‍රයෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී. එම අසත්‍යතාවය අපේක්ෂකයා/අපේක්ෂිකාව තෝරා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වේ.

15. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට/අයදුම්කාරියන්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

එච්. ඩී. අබේවික්‍රම,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

කොළඹ,
තැපැල් පෙට්ටිය 594
ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ දී ය.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා අයදුම්පත**

1. සම්පූර්ණ නම :————.
(ජාතික හැඳුනුම්පතට අනුව)

2. ජාතික හැඳුනුම්පත් අංකය :————.

3. ඉල්ලුම් කරනු ලබන වෘත්තිය :————.

4. තැපැල් ලිපිනය (ලිපි එවිය යුතු ලිපිනය) :————.

5. ස්ථිර ලිපිනය :————.

6. ආසන්නතම ගුවන් හමුදා කඳවුර :————.

7. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

8. දිස්ත්‍රික්කය:————.

9. මැතිවරණ කොට්ඨාසය :————.

10. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

11. දුරකථන අංකය :————.

12. උපන් දිනය :————.

13. වයස (2014 ජූලි මස 31 වන දිනට) ඃ අවුරුදු :————. මාස :————. දින :————.

14. විවාහක/අවිවාහක බව :————.

15. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

16. උස ඃ අඩි :————. අඟල් :————.

17. අ. පො. ස. (සා/පෙළ) විභාගය :

| අවුරුද්ද | විභාග අංකය | සමත් වූ විෂයයන් | ලැබූ ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |

18. අ. පො. ස. (උ/පෙළ) විභාගය :

| අවුරුද්ද | විභාග අංකය | සමත් වූ විෂයයන් | ලැබූ ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |

19. තනතුර සඳහා විශේෂ සුදුසුකම් (උදාහරණ වශයෙන් කාර්මික හෝ වෙනත් වෘත්තීය පුහුණුව සහ පළපුරුද්ද ආදිය) :————.

20. ක්‍රීඩා අතින් ලබා ඇති විශිෂ්ඨතා පිළිබඳ විස්තර :————.

21. පාසලේ දී හෝ බාහිර සංවිධාන වලදී ලබා ඇති වෙනත් විශිෂ්ටතා :————.

22. මීට පෙර සන්නද්ධ සේවා හෝ පොලිස් සේවයට ඉල්ලුම් කර ඇත්තම් ඒ පිළිබඳ විස්තර :————.

23. සිවිල් හෝ යුද්ධ අධිකරණයේ දී වැරදිකරු වී ඇති හෝ ඇඟ බැඳ හෝ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :————.

24. *චරිත සහතික පිළිබඳ විස්තර* :

| නම | පදවි නාමය | ලිපිනය |
|---|---|---|
| | | |

25. *ඉල්ලුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය* :

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ උපරිම දැනුමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ/ඉල්ලුම්කාරියගේ අත්සන.

දිනය :————.

01-904

---

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### නිලධාරි පුරප්පාඩු

ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ පහත සඳහන් ශාඛාවන්හි ඉඳුරාම අධිකාරියට පත්කොට බඳවා ගැනීමට පිරිමි/කාන්තා අපේක්ෂකයින් සඳහා පුරප්පාඩු පවතී. :-

(අ) ගුවන් තොටුපළ නිර්මාණ ශාඛාව;
(ආ) වෛද්‍ය ශාඛාව;
(ඇ) දන්ත වෛද්‍ය ශාඛාව;

2. පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ඇති පිරිමි/කාන්තා අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. :-

(අ) ගුවන් තොටුපළ නිර්මාණ ශාඛාව
ද්‍රව්‍ය ඉංජිනේරු නිලධාරීන් (තාර යන්ත්‍රෝපකරණ සඳහා) - පිරිමි (නිත්‍ය/ස්වේච්ඡා) :

*ප්ලයිට් ලෙප්ටිනන්ට්*:—සිවිල් ඉංජිනේරු හෝ ද්‍රව්‍ය ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂිත වූ විද්‍යාවේදී උපාධිය සමග උපාධි සුදුසුකම් වලින් පසුව මහාමාර්ග සහ ගුවන් ධාවන පථ ඉදිකිරීමට භාවිතා කරන තාර මිශ්‍රණ යන්ත්‍ර පිළිබඳව සහ තාර මිශ්‍රණ තත්ත්ව පරීක්ෂණ පිළිබඳව අවම වශයෙන් වසරක (1) පලපුරුද්දක් තිබිය යුතු අතර මහාමාර්ග සහ ගුවන් ධාවන පථ ඉදිකිරීමට භාවිතා කරන මිශ්‍රණ සැදීම, ඒ සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ හැකියාව සහ බහුවිධ පරීක්ෂණාගාර පරිපාලන කිරීමෙහිලා මනා දැනුමක් සහ පලපුරුද්දක් තිබීම ; හෝ

ද්‍රව්‍ය විද්‍යාව පිළිබඳ විශේෂිත වූ විද්‍යාවේදී උපාධිය සමග උපාධි සුදුසුකම් වලින් පසුව මහාමාර්ග සහ ගුවන් ධාවන පථ ඉදිකිරීමට භාවිතා කරන තාර මිශ්‍රණ යන්ත්‍ර පිළිබඳව සහ තාර මිශ්‍රණ තත්ත්ව පරීක්ෂණ පිළිබඳව අවම වශයෙන් වසර දෙකක (2) පලපුරුද්දක් තිබිය යුතු අතර මහාමාර්ග සහ ගුවන් ධාවන පථ ඉදිකිරීමට භාවිතා කරන මිශ්‍රණ සැදීම, ඒ සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ හැකියාව සහ බහුවිධ පරීක්ෂණාගාර පරිපාලන කිරීමෙහිලා මනා දැනුමක් සහ පලපුරුද්දක් ලබා තිබිය යුතුයි.

*ෆ්ලයින් ඔෆිසර්*.—සිවිල් ඉංජිනේරු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (එන්. ඩී. ටී)/ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (එන්. ඩී. ඊ.එස්)/උසස් ජාතික ඩිප්ලෝමාව (එච්. එන්. ඩී. ඊ) සුදුසුකම් ලබා තිබිය යුතු අතර ඩිප්ලෝමා සුදුසුකම් වලින් පසුව මහාමාර්ග සහ ගුවන් ධාවන පථ ඉදිකිරීමට භාවිතා කරන තාර මිශ්‍රණ යන්ත්‍ර පිළිබඳව සහ තාර මිශ්‍රණ තත්ත්ව පරීක්ෂණ පිළිබඳව අවම වශයෙන් වසර තුනක (3) අදාළ ක්ෂේත්‍රයේ පලපුරුද්දක් ලබා තිබිය යුතුයි.

**ගොඩනැගිලි සේවා ඉංජිනේරු නිලධාරීන් - පිරිමි (නිත්‍ය/ස්වේච්ඡා)**

*තාවකාලික ස්කොඩ්‍රන් ලීඩර්*.—සිවිල්/යාන්ත්‍රික/විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂිත වූ විද්‍යාවේදී උපාධිය සහ විද්‍යාපති (ගොඩනැගිලි සේවා ඉංජිනේරු) උපාධිය සමග වායුසමීකරණ, ජලසැපයුම්, සනීපාරක්ෂක, මහජන සෞඛ්‍යය, ගිනි ආරක්ෂණය, විදුලි සෝපාන ආදී නව තාක්ෂණික ක්‍රමෝපායන් භාවිතයෙන් ගොඩනැගිලි නිර්මාණය/ඉදිකිරීම පිළිබඳව විද්‍යාපති උපාධියෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (2) පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

**සිවිල්/විදුලි ඉංජිනේරු - පිරිමි (නිත්‍ය/ස්වේච්ඡා)**

ප්ලයිට් ලෙප්ටිනන්ට් : සිවිල්/විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂිත වූ විද්‍යාවේදී උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම.

*ෆ්ලයින් ඔෆිසර්*.—සිවිල්/විදුලි ඉංජිනේරු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (එන්. ඩී. ටී)/ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (එන්. ඩී. ඊ. එස්)/උසස් ජාතික ඩිප්ලේමාව (එච්. එන්. ඩී. ඊ) හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබිය යුතු අතර ඩිප්ලෝමා සුදුසුකම් වලින් පසුව අදාළ ක්ෂේත්‍රයේ වසර තුනකට (3) නොඅඩු පලපුරුද්දක් ලබා තිබීම.

*පයිලට් ඔෆිසර්* : සිවිල්/විදුලි ඉංජිනේරු ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමාව (එන්. ඩී. ටී)/ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (එන්. ඩී. ඊ.එස්)/උසස් ජාතික ඩිප්ලෝමාව (එච්. එන්. ඩී.ඊ) හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබිය යුතු අතර ඩිප්ලෝමා සුදුසුකම් වලින් පසුව අදාළ ක්ෂේත්‍රයේ වසර තුනකට (3) නොඅඩු පලපුරුද්දක් ලබා තිබීම.

**ප්‍රමාණ සමීක්‍ෂක නිලධාරීන් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)**

*ෆ්ලයිට් ලෙප්ටිනන්ට්.*—මොරටුව විශ්ව විද්‍යාලය මගින් පිරිනමන ලද BSc in (QS) උපාධිය හෝ ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයින්ගේ ආයතනයේ සාමාජිකත්වය (Graduate Member) සමග සාමාජිකත්වයෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ තනතුර පිළිබඳව වසර දෙකක (2) පළපුරුද්දක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයින්ගේ ආයතනයේ සාමාජිකත්වය (Technical Member) ලබා තිබීම සමග සාමාජිකත්වයෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ තනතුර පිළිබඳව වසර තුනක (3) පලපුරුද්දක් ලබා තිබීම.

*ෆ්ලයින් ඔෆිසර්.*—ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්‍ෂකයින්ගේ ආයතනයේ සාමාජිකත්වය (Technical Member) ලබා තිබීම හෝ රත්මලාන Univotec ආයතනයේ සම්පූර්ණයෙන් නිම කරන ලද ප්‍රමාණ සමීක්‍ෂක ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම සමග ඩිප්ලෝමා සුදුසුකම් වලින් පසුව අදාළ ක්ෂේත්‍රයේ තනතුර පිළිබඳව වසර දෙකක (2) පලපුරුද්දක් ලබා තිබීම.

**මිනින්දෝරුවන් - පිරිමි (නිත්‍ය/ස්වේච්ඡා)**

*ෆ්ලයිට් ලෙප්ටිනන්ට්.*—සබරගමුව විශ්ව විද්‍යාලය මගින් පිරිනමන ලද මිනින්දෝරු විද්‍යාවේදී උපාධිය හෝ දියතලාව මිණුම් සහ සිතියම් ගත කිරීමේ ආයතනයෙන් පිරිනමන ලද උපාධිය ලබා තිබීම.

*ෆ්ලයින් ඔෆිසර්.*—දියතලාව මිණුම් සහ සිතියම් ගත කිරීමේ ආයතනයෙන් පිරිනමන ලද මිනින්දෝරු ඩිප්ලෝමාවක් ලබා තිබීම.

(*ආ*) *වෛද්‍ය ශාඛාව*

*වෛද්‍ය නිළධාරීන් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)*

*ෆ්ලයිට් ලෙප්ටිනන්ට්.*—පිළිගත් විශ්ව විද්‍යාලයක වෛද්‍ය (එම්. බී. බී. එස්) උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම සහ වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වී තිබිය යුතුය.

පූර්ව සීමාවාසික වෛද්‍ය උපාධිලාභීන් - පිරිමි/කාන්තා (නිත්‍ය)

MBBS (ශ්‍රී ලංකා) හෝ විදේශ වෛද්‍ය විද්‍යාලයකින් සමත්වූ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත හැකි MBBS (ශ්‍රී ලංකා) උපාධියට සමාන වෛද්‍ය උපාධියක් අනිවාර්‍යයෙන්ම ලබා තිබිය යුතුය. සුසුකම් ඇති තෝරාගත් අයදුම්කරුවන් නිත්‍ය අධිකාරිලත් නිළධාරීන් ලෙස බඳවාගනු ලැබේ. බඳවාගත් දින සිට අවුරුදු පහක් (5) ඇතුළත ERPM විභාගය සමත් වී ශ්‍රී ලංකා වෛද්‍ය සභාව් ස්ථිර ලියාපදිංචිය ලබා ගත යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරුවන් ෆ්ලයින් ඔෆිසර් නිළයෙහි අධිකාරිලත් නිළධාරීන්ලෙස බඳවා ගනු ලබන අතර ERPM විභාගය සමත් වී ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ස්ථිර ලියාපදිංචියෙන් පසු ෆ්ලයිට් ලෙප්ටිනන්ට් නිළය ලබා දීම පිළිබඳව සලකා බලනු ලැබේ.

(*ඇ*) *දන්ත වෛද්‍ය ශාඛාව* :

දන්ත වෛද්‍ය නිලධාරීන් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා) :

*ෆ්ලයිට් ලෙප්ටිනන්ට්.*—පිළිගත් විශ්ව විද්‍යාලයක දන්ත වෛද්‍ය (බී. ඩී. එස්.) උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම සහ වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වී තිබිය යුතු ය.

**පූර්ව සීමාවාසික දන්ත වෛද්‍ය උපාධිලාභීන් - පිරිමි/කාන්තා (ස්වේච්ඡා)**

BDS (ශ්‍රී ලංකා) හෝ විදේශ දන්ත වෛද්‍ය විද්‍යාලයකින් සමත්වූ ශ්‍රී ලකා වෛද්‍ය සභාව මගින් පිළිගත හැකි BDS (ශ්‍රී ලංකා) උපාධියට සමාන වෛද්‍ය උපාධියක් අනිවාර්‍යයෙන්ම ලබා තිබිය යුතු ය. සුදුසුකම් ඇති තෝරාගත් අයදුම්කරුවන් ස්වේච්ඡා අධිකාරිලත් නිලධාරීන් ලෙස බඳවාගනු ලැබේ. බඳවාගත් දින සිට අවුරුදු පහක් (5) ඇතුළත ERPM විභාගය සමත් වී ශ්‍රී ලංකා දන්ත වෛද්‍ය සභාවේ ස්ථිර ලියාපදිංචිය ලබා ගත යුතු ය. එසේ වෛද්‍යවරයෙකු ලෙස ස්ථිරව ලියාපදිංචි වීමට අපොහොසත් වන නිලධාරීන්ගේ සේවය අවුරුදු පහකට (5) පසු අත්හිටුවනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරුවන් ෆ්ලයින් ඔෆිසර් නිලයෙහි අධිකාරිලත් නිලධාරීන් ලෙස බඳවා ගනු ලබන අතර ERPM විභාගය සමත් වී ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ස්ථිර ලියාපදිංචියෙන් පසු ෆ්ලයිට් ලෙප්ටිනන්ට් නිලය ලබා දීම පිළිබඳව සලකා බලනු ලැබේ.

**දන්ත වෛද්‍ය ශිෂ්‍යයන් - පිරිමි/කාන්තා (නිත්‍ය) :**

*පයිලට් ඔෆිසර්.*—බී. ඩී. එස්. දෙවන කොටස සම්පූර්ණ කර දැනට තුන්වන වසරේ දන්ත වෛද්‍ය (බී. ඩී. එස්.) උපාධිය සඳහා ඉගෙනුම ලබන සිසුන් හට මේ සඳහා අයදුම් කළ හැක.

*ෆ්ලයින් ඔෆිසර්.*—අවසාන බී. ඩී. එස්. පළමු කොටස සම්පූර්ණ කර දැනට අවසන් වසරේ දන්ත වෛද්‍ය (බී. ඩී. එස්.) උපාධිය සඳහා ඉගෙනුම ලබන සිසුන් හට මේ සඳහා අයදුම් කළ හැක.

*සැලකිය යුතුයි* :

1. තෝරාගනු ලබන දන්ත වෛද්‍ය ශිෂ්‍ය අයදුම්කරුවන් ෆ්ලයිට් ලෙප්ටිනන්ට් නිලයෙහි ස්ථිර අධිකාරියට පත් කරනු ලැබූ දින සිට වසර දහයක (10) අනිවාර්‍ය සේවයකට යටත් කරනු ලැබේ.
2. තෝරාගනු ලබන දන්ත වෛද්‍ය සිසුන් අවසන් වසර සම්පූර්ණ කරන තුරු ගුවන් හමුදාවෙන් නිදහස් කරනු ලැබේ. දන්ත වෛද්‍ය (බී. ඩී. එස්.) උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු සහ වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වීමෙන් අනතුරුව ඔවුන් ෆ්ලයිට් ලෙප්ටිනන්ට් නිලයෙහි ස්ථිර අධිකාරියට පත් කරනු ලැබේ.
3. පශ්චාත් උපාධි අධ්‍යාපන කටයුතු සඳහා සේවා අවශ්‍යතාවයන් මත අවස්ථාවක් දෙනු ලැබේ.
4. දන්ත වෛද්‍ය සිසුන් තම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වසර තහවුරු කරගත හැකි ලියවිල්ලක් අයදුම්පත සමග එවිය යුතු ය.;

3. *අනෙකුත් සුදුසුකම්* :

(*අ*) *පුරවැසිභාවය* : ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය ;
(*ආ*) *සිවිල් තත්වය* : විවාහක/අවිවාහක ;
(*ඇ*) *ස්ත්‍රී පුරුෂ භාවය* : පිරිමි/කාන්තා (අදාළ පරිදි)
(*ඈ*) *වයස* : 2014 මාර්තු මස 31 වැනි දිනට;

*(1) ගුවන් තොටුපළ නිර්මාණ, වෛද්‍ය සහ දන්ත වෛද්‍ය (වෛද්‍ය/දන්ත වෛද්‍ය නිලධාරීන්, පූර්ව සීමාවාසික වෛද්‍ය/දන්ත වෛද්‍ය උපාධිලාභීන්) ශාඛාවන් වල අපේක්ෂකයින් සඳහා : අවුරුදු 18 සිට 35 දක්වා*

*(2) දන්ත වෛද්‍ය (දන්ත වෛද්‍ය ශිෂ්‍යයන්) ශාඛාවේ අපේක්ෂකයින් සඳහා පමණක් : අවුරුදු 18 සිට 30 දක්වා*

(ඉ) *උස :* පිරිමි - අඩි 5 අඟල් 5 ක් හෝ ඊට වැඩි විය යුතු ය;
කාන්තා - අඩි 5 අඟල් 4 ක් හෝ ඊට වැඩි විය යුතු ය ;
(ඊ) *බර :* ශරීර ස්කන්ධ දර්ශකය ගුවන් හමුදා ශාරීරික නිපුණතා පරීක්ෂණ ප්‍රමිතියට අදාලව විය යුතුයි.
(උ) *පපුව :* අඟල් 32ට නොඅඩු විය යුතුයි (පිරිමි);
(ඌ) *වර්ණ දෘෂ්ටිය :* සීපී2;
(එ) *දෘෂ්ඨි තීක්ෂණත්වය :* වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් සහිතව හෝ රහිතව).

4. යම් අයදුම්කරුවෙකුගේ උස/බර නියමිත පරිදි නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ මනාපය පරිදි ඔහු/ඇය ගැන සලකා බලනු ලැබේ.

5. ගුවන් හමුදාධිපතිවරයා විසින් නියම කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීමට හැකි ආකාරයට මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතු ය.

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ වර්තමාන විශිෂ්ඨ දක්ෂතා ලබා තිබීම පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

7. *රාජ්‍ය භාෂා අවශ්‍යතා* :— තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පවත්නා, පනවා ඇති සහ මතු පනවනු ලබන්නා වූ ද ව්‍යවස්ථා පිළිපැදිය යුතු ය.

8. තෝරාගනු ලබන අපේක්ෂකයින්ට ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර්/ෆ්ලයින් ඔෆිසර්/ෆ්ලයිට් ලෙප්ටිනන්ට් ස්කොඩ්‍රන් ලීඩර් යන නිලයන්හි නිත්‍ය/ස්වේච්ඡා අධිකාරියට පත්කරනු ලැබේ.

9. තෝරාගනු ලබන අපේක්ෂකයින් ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලැබිය හැකි ස්ථානයක දී පුහුණුවක් ලැබිය යුතු ය. පුහුණුවන අවස්ථාවේ දී විෂමාචාරය නිසා හෝ තමාට පාලනය කරගත හැකිව තිබූ වෙනත් කරුණු නිසා හෝ නිලධාරියෙකුට නුසුදුසු බවට වගකිව යුත්තන් විසින් වාර්තා කරනු ලැබුවහොත් එම නිලධාරියාට පිරිනමනු ලැබූ අධිකාරිය ආපසු ගැනීම සහ/හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විනය රෙගුලාසිවලට අනුකූලව වෙනයම් විනයානුකූල ක්‍රියාමාර්ගයන්ට යටත්වීමට හෝ බැඳී සිටින්නේය.

10. විටින් විට පනවනු ලබන ගුවන් හමුදා නියෝග අනුව ගුවන් හමුදා නිලධාරීන් පාලනය කරනු ලැබේ.

11. 1951 අප්‍රේල් මස 27 වැනි දින අංක 10,240 දරන *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධනය කරන ලද, ශ්‍රී ලංකා ගුවන් හමුදා (නිත්‍ය හා නිත්‍ය උපසේවා) රෙගුලාසි අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරියෙකුගේ සේවා කොන්දේසි වේ. සුදුසුකම් අනුව පයිලට් ඔපිසර් හෝ උසස් නිලයක නිත්‍ය/ස්වේච්ඡා අධිකාරියක් පිරිනමනු ලැබේ. ගුවන් හමුදා පනතේ 10 වැනි වගන්තිය අනුව “සෑම නිලධාරියෙකුම සේනාධිනායකයාගේ මනාපය පරිදි තම පත්වීමේ සිටිය හැක”. කෙසේ වෙතත් තම අධිකාරියෙන් අස්වීමට නිලධාරියෙකුට බලයක් නැති අතර, ගුවන් හමුදා පනතේ 11 වැනි වගන්තිය අනුව සේනාධිනායක විසින් අස්වීමට ඉඩදිය හැක. ඇප/ගිවිසුම් බැඳී ඇත්නම් පුහුණු කාලය සහ පාඨමාලාවන් හදාරන්නේ නම් ඉහත සඳහන් පරිදි ගුවන් හමුදා පනතේ 11 වැනි වගන්තිය අනුව අස්වීමට නොහැක. ගුවන් හමුදාවේ විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂිත රෙගුලාසිවලට අනුව ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගැනීමට හැකි වේ.

12. ගුවන් හමුදා නිලධාරීන් රාජකාරි හෝ පුහුණුව සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ කවර තැනකට වුව ද යවනු ලැබීමට යටත් වේ.

13. අවිවාහක නිලධාරීන්, නිලධාරි නිවස්නයේ වාසය කළ යුතු ය. ගෘහ භාණ්ඩ සහ නවාතැන් පහසුකම් හා ආහාරපාන ඔහුට/ඇයට සපයනු ලැබේ. බැට්මන් සේවය ද සපයනු ලැබේ. අවිවාහක නිලධාරීන්ගේ ආහාර දීමනාව සහ බැට්මන් දීමනාව භෝජනාගාරයට ගෙවනු ලැබේ.

14. විවාහක නිලධාරීන්ට විවාහක නිවාස ඇත්නම් සපයනු ලැබේ. මේ සඳහා රජයේ ආයතන සංග්‍රහයට අනුව කුලිය අයකරනු ලැබේ. විවාහක නිලධාරීන් විවාහක නිවස්නයක වාසය කරනු නොලබන්නේ නම් 15(ඈ)(17) ඡේදයේ පරිදි නිවාස කුලී දීමනාවන් හිමි වේ.

15. (අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරිලත් නිලධාරීන්ගේ වැටුප් පහත සඳහන් පරිදි වේ :

පයිලට් ඔෆිසර් - රු. 2,42,700 වසරකට
ෆ්ලයින් ඔෆිසර් - රු. 2,75,220 — 34 x 7,740 = රු. 5,38,380 වසරකට
ෆ්ලයිට් ලෙප්ටිනන්ට් - රු. 3,21,660 — 28 x 7,740 = රු. 5,38,380 වසරකට
ස්කොඩ්‍රන් ලීඩර් - රු. 3,52,620 — 24 x 7,740 = රු. 5,38,380 වසරකට
විංග් කමාන්ඩර් - රු. 3,62,100 — 20 x 9,480 = රු. 5,51,700 වසරකට
ගෲප් කැප්ටන් - රු. 4,41,060 — 18 x 12,600 = රු. 6,67,860 වසරකට

(ආ) වෛද්‍ය නිලධාරීන්ගේ වැටුප් :

ප්‍රාථමික ශ්‍රේණිය - රු. 3,13,920 - 2 x 7,740 = රු. 3,29,400 වසරකට
2 වැනි ශ්‍රේණිය - රු. 3,37,140 - 8 x 7,800 = රු. 3,99,540 වසරකට
1 වැනි ශ්‍රේණිය - රු. 4,12,140 - 15 x 12,600 = රු. 6,01,140 වසරකට.
විශේෂ ශ්‍රේණිය - රු. 5,08,680 - 12 x 15,720 = රු. 6,97,320 වසරකට.

(ඇ) දන්ත වෛද්‍ය නිලධාරීන්ගේ වැටුප් :

දන්ත වෛද්‍ය - රු. 3,06,180 - 3 x 7,740 = රු. 3,29,400 වසරකට
2 වැනි ශ්‍රේණිය - රු. 3,37,140 - 8 x 7,800 = රු. 3,99,540 වසරකට
1 වැනි ශ්‍රේණිය - රු. 4,12,140 - 15 x 12,600 = රු. 6,01,140 වසරකට.
විශේෂ ශ්‍රේණිය - රු. 5,08,680 - 12 x 15,720 = රු. 6,97,320 වසරකට.

(ඈ) අනෙකුත් දීමනා වෛද්‍ය/දන්ත වෛද්‍ය ශාඛාවේ නිලධාරීන් සඳහා

(1) *විශ්‍රාම හිමි වැටුප් දීමනා -*

| | | |
|---|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - | රු. 1,700 (මසකට) |
| 2 වැනි ශ්‍රේණිය | - | රු. 1,700 (මසකට) |
| 1 වැනි ශ්‍රේණිය | - | රු. 3,400 (මසකට) |
| විශේෂ ශ්‍රේණිය | - | රු. 3,400 (මසකට) |

(2) *විශ්‍රාම වැටුප් රහිත දීමනා -*

| | | |
|---|---|---|
| දන්ත වෛද්‍ය | - | රු. 2,125 (මසකට) |
| 2 වැනි ශ්‍රේණිය | - | රු. 1,700 (මසකට) |
| 1 වැනි ශ්‍රේණිය | - | රු. 400 (මසකට) |

(3) අමතර රාජකාරි දීමනාව - රු. 25,000 (මසකට)

(4) *අතිරේක රාජකාරි දීමනාව -*

| | | |
|---|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - | රු. 335 (පැයකට) |
| 2 වැනි ශ්‍රේණිය | - | රු. 383 (පැයකට) |
| 1 වැනි ශ්‍රේණිය | - | රු. 528 (පැයකට) |
| විශේෂ ශ්‍රේණිය | - | රු. 628 (පැයකට) |

(5) (15) (ඈ) ඡේදයේ දැක්වෙන සේවා දීමනා අදාල පරිදි අමතරව ගණනය කරනු ලැබේ.

(ඉ) *අනෙකුත් දීමනා :*

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 6,600 ක් ගෙවනු ලැබේ.
(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනා වශයෙන් මසකට රු. 250ක් ගෙවනු ලැබේ.
(3) දුෂ්කර දීමනා මසකට රු. 600ක් ගෙවනු ලැබේ.
(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට අමතර දුෂ්කර දීමනා මසකට රු. 4,400 ක් ගෙවනු ලැබේ.
(5) විශේෂ දීමනාව මසකට රු. 3,000ක් ගෙවනු ලැබේ. (දිනකට රු. 100 බැගින් ගෙවනු ලැබේ.).
(6) අතිරේක දීමනාව මසකට රු. 1,000 ක් ගෙවනු ලැබේ.
(7) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 255ක් ගෙවනු ලැබේ.
(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා).
(9) ආහාර දීමනාව මසකට රු. 14,449.80 ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා).
(10) සුදුසුකම් වේතනය අදාළ පරිදි (මසකට උපරිමය රු. 637.50ක්) ගෙවනු ලැබේ.
(11) විශේෂ දීමනාවක් ලෙස මසකට මූලික වැටුපෙන් 20% මුදලක් ගෙවනු ලැබේ.
(12) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට/බිරිඳ/සහ දරුවන්ට) දෙනු ලැබේ.
(13) කඳවුර තුළ වාසය කරන නිලධාරීන්ට මසකට වරක් නිලධාරී නිවස්නයේ සිට තම නිවාසයට යෑම සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍රයක්, කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.
(14) නිල ඇඳුම් හා ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.
(15) නොමිලේ වෛද්‍ය පහසුකම් (තම පවුලේ සාමාජිකයන්ට අදාළ පරිදි).
(16) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරීන්ට සැතපුම් 30ක් තුළ රාජකාරි ස්ථානයට නොමිලේ ගමන් කිරීම සඳහා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ බලපත්‍රයක් දෙනු ලැබේ.
(17) රජයේ නිවාසවල වාසය නොකරන විවාහක නිලධාරීන්හට පහත සඳහන් පරිදි නිවාස කුලී දීමනාවක් හිමි වේ. පයිලට් ඔපිසර් සිට ගෲප් කැප්ටන් සහ ඊට ඉහළ නිලයන් සඳහා මසකට රු. 1,600 සිට රු. 4,250 දක්වා.
(18) සේවා දීමනා මාසිකව රු.300, රු.400, රු. 500 සුදුසු පරිදි වේ. (සම්පූර්ණ කරන ලද සේවා කාලයන්ට අනුව වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි)
(19) අමතර සේවා දීමනා මසකට රු. 1,500 (වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි.)
(20) 1/20 දීමනාව මසකට - මූලික වැටුප x 1/20 x උපරිම දින 3 (වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණි)
(21) අමතර රාජකාරි ගෙවීම් මසකට - උපරිම පැය 120 (වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි)

16. *විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා.*—විටින් විට සංශෝධනය කරනු ලැබූ සහ 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලුම නිලධාරීන් දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුවය.

17. *ඉල්ලුම්කරුවන්ට උපදෙස් :–*

(අ) පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම්පතේ සියලුම කොටු හැකි පමණ විස්තර හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතු ය. ඉල්ලුම්පත් 2014 පෙබරවාරි මස 10 වැනි දින මධ්‍යාහ්න 1200ට හෝ ඊට පෙර ලැබෙන සේ "විධායක ආධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරි, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ඒකල, කොටුගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහාලන කවරයේ "................... ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් විය යුතු ය. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් සලකා බලනු නොලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයෙහි නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය. යම් හෙයකින් අයදුම්කරු තෝරාගතහොත් තම කාර්යයෙන් නිදහස් කරන බවට සේවා යෝජකයා විසින් ලිපියක් මගින් දැනුම් දිය යුතු ය.

(ඇ) ඉල්ලුම්පත් සමග අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකපත් වල පිටපත් ඉදිරිපත් කළ යුතු ය :
(1) උප්පැන්න සහතිකය;
(2) ලබා ඇති උසස්ම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික;
(3) ඉල්ලුම්කරු පෞද්ගලිකව දන්නා වගකිව යුතු පුද්ගලයන් යටත් පිරිසෙයින් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික;
(4) ක්‍රීඩා, ශිෂ්‍ය භට පුහුණු ආදී සනාථ කරන සහතික;
(5) ඉල්ලුම්පතේ යම් යම් හිමිකම් කර ඇතොත් ඒවා සනාථ කරන සහතික.

*සැලකිය යුතුයි.-* මෙම සහතිකවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුත්තේ අපේක්ෂකයා සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබුවහොත් ඒ අවස්ථාවේ දී පමණි.

18. ඉල්ලුම්පතේ අසත්‍ය ප්‍රකාශයක් කර තිබේ නම් එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අහිමිවීමට ද, තෝරාගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වේ.

19. *තෝරාගැනීම, සම්මුඛ පරීක්ෂණ ආදිය :–*

(අ) ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට හා වෛද්‍ය පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරනු ලැබේ.

(ආ) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

(ඇ) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ඇය විසින් ඉදිරිපත් කළ යුතුය.

(ඈ) අවසාන සම්මුඛ පරීක්ෂණයට සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය.

(ඉ) අපේක්ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත්, එසේ කළ යුත්තේ ඔහුට/ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ දැරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේය.

(ඊ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින් වෙත ඒ බව දන්වා එවනු නොලැබේ.

එච්. ඩී. අබේවික්‍රම,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ.

**ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ ........... ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.).
2. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.
3. ජාතික හැඳුනුම්පත් අංකය :————.
4. ඉල්ලුම් කරන ශාඛාව :————.
5. ඉල්ලුම් කරන තනතුර :————.
6. ස්ථිර ලිපිනය :————.
7. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.
8. තැපැල් ලිපිනය :————.
9. විද්‍යුත් ලිපිනය :————.
10. උපන් දිනය :————.
11. උස : අඩි :——— අඟල් :———.
12. දිස්ත්‍රික්කය :————.
13. ඡන්ද කොට්ඨාසය :————.
14. ග්‍රාම සේවක කොට්ඨාසය සහ අංකය :————.
15. දුරකථන අංකය :————.
16. විවාහක හෝ අවිවාහක බව :————.
17. පාසල් සහ/හෝ විශ්ව විද්‍යාල පිළිබඳ විස්තර :

| *පාසලේ/ විශ්ව විද්‍යාලයේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුලුව)* |
|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) :<br>අ.පො.ස. (උ.පෙළ) :<br>වෘත්තීය සුදුසුකම් :<br>වෙනත් : | | |

18. පාසලෙන්/විශ්ව විද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තරඃ

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

19. මව්පියන් පිළිබඳ විස්තර :-

| *සම්පූර්ණ නම* | *උපන් ස්ථානය* | *රැකියාව* | *දැනට ලිපිනය* |
|---|---|---|---|
| පියා :- | | | |
| මව :- | | | |

20. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.
21. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර ඃ (ඔබ සහභාගී වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න.) :————.
22. පාසලේ දී, විශ්ව විද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න) :————.
23. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :————.
24. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම් කර තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.
25. සිවිල් හෝ යුද්ධ උසාවියක දී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.
26. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්ව විද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

27. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

28. *අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :*

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

01-905

## ජාතික පොලිස් කොමිෂන් සභාව

ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පහත සඳහන් තනතුර සඳහා අදාල සුදුසුකම් සපුරා ඇති නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. පළාත් අධ්‍යක්ෂ තනතුර දකුණු පළාත - තනතුරු 01 යි.

(i) දීප ව්‍යාප්ත සේවාවක I වැනි පංතියේ හෝ විශේෂ ශ්‍රේණියේ තනතුරක සේවය කර විශ්‍රාම ගිය වයස අවුරුදු 67 නොඉක්මවූ නිලධාරියෙකු විය යුතු අතර වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ.

(ii) සම්බන්ධීකරණ හා විමර්ශන කටයුතු පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතුය.

(iii) තෝරා ගනු ලබන නිලධාරින් සඳහා සියළු දීමනා ඇතුළත්ව රු. 25,000 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

තම ජීවදත්ත තොරතුරු ඇතුලත් අයදුම්පතක් 2014.02.28 දින හෝ ඊට පෙර ලේකම් ජාතික පොලිස් කොමිෂන් සභාව, අංක 09 ගොඩනැගිල්ල, බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර අයදුම්පත් එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමන් ඉල්ලුම් කරන තනතුර සඳහන් කර එවිය යුතුය.

ටී. එම්. කේ. බී. තෙන්නකෝන්,
ලේකම්,
ජාතික පොලිස් කොමිෂන් සභාව.

01-934

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

**ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවෙහි උද්‍යානවල පුරප්පාඩු වී පවතින උද්‍යාන වැඩ මූලික තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය**

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තම්න්තුව යටතේ පවතින උද්භිද උද්‍යාන සඳහා කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණයේ උද්‍යාන වැඩ මූලික තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02 *සේවා කොන්දේසි.*—තෝරාගනු ලබන අපේක්ෂකයා පහත සඳහන් කොන්දේසිවලට යටත්ව සේවා ගණයේ III වැනි ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

(ii) පත්වීම් ලැබූ දින සිට වසර 3 ක පරිවාස කාලයකට යටත් වේ.

(iii) තෝරා ගනු ලබන නිලධාරින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග වෙනත් රජයේ චක්‍රලේඛ හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති යටතේ දැනට පවත්නා හා ඉදිරියේදී වන සංශෝධන ඇතුළත් නීති රීති, ව්‍යවස්ථා සහ විධි විධානවලට යටත්ව කටයුතු කළ යුතු වේ.

(iv) III ශ්‍රේණිය සඳහා පත්කරන ලද දින සිට වසර 3 ක් ඇතුළත 1 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය.

(v) එසේම 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 පරිදි දෙවැනි රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවයක් ලබා ගත යුතුය.

03. *වැටුප් බණ්ඩය හා පරිමාණය :*

(i) වැටුප් බණ්ඩය - MT - 1 - 2006A

(ii) වැටුප් පරිමාණය -14425-10 x 145 -11 x 170 - 6 x 240 - 14 x 320 -රු. 23665/-
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 (iv) අනුකූලව)

04. *සුදුසුකම් :*

04.1. (i) අධ්‍යාපන සුදුසුකම් : සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය සමත්වී තිබීම.

(ii) වෘත්තීය සුදුසුකම් : තනතුරෙහි කාර්යභාරයට අදාලව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) ට

සමාන හෝ ඊට ඉහළ මට්ටමේ කෘෂිකර්ම / උද්‍යාන අලංකරණ / මල් වගාව හෝ තවාන් පාලනය සම්බන්ධ උද්භිද උද්‍යාන අංශයේ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.

(iii) පළපුරුද්ද — අදාල ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැළකේ.

04.2 *වෙනත් සුදුසුකම්* ඃ

(i) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.

(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍යවන ඉහත අනු අංක 4.1. (i) සුදුසුකම් හා අනු අංක 4.1. (ii) යටතේ සඳහන් සුදුසුකම් මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අයදුම්පත් කැඳවා අවසාන වන දිනට සෑම අයුරකින්ම සම්පූර්ණ කළ යුතුය.

(iv) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් වන කායික හා මානසික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු අතර රජයේ වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(v) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35 ට වැඩි නොවිය යුතුය. (දැනටමත් රජයේ ස්ථිර සේවයේ යෙදෙන නිලධාරීන් සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව අදාල නොවේ.)

05. *අයදුම් කිරීමේ පිළිවෙල* ඃ

මෙම දැන්වීමේ සඳහන් ආකෘතියට අනුව A4 (81/2" X 12") ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත් සකස් කර ගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය " අධ්‍යක්ෂ ජනරාල්, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, තැ. පෙ. 14 , පේරාදෙණිය" යන ලිපිනයට 2014 පෙබරවාරි මස 24 දා හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය බහාලූ ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

06. *විභාග ගාස්තුව* ඃ

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර, ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් පේරාදෙණිය, ලංකා බැංකුවේ ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්ගේ ගිණුම් අංක 0007040743 ට රු. 400/- ක මුදලක් ගෙවා අදාල රිසිට් පත අයදුම්පතෙහි අදාල කොටුවේ ඇලවිය යුතුය. (එහි ඡායා පිටපතක් තමා සතුව තබා ගත යුතුය.)

07. තෝරා ගැනීමේ ක්‍රමවේදය.—ලිඛිත විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

07.1 *ලිඛිත විභාගය* ඃ

I. සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය හා අදාල විෂය ක්ෂේත්‍ර පිළිබඳ දැනුම මැන බැලෙන ඒකාබද්ධ ප්‍රශ්න පත්‍රයකි.

මෙම විභාගය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලැබේ. වැඩිම ලකුණු ලබා තරග විභාගය සමත්වන්නන් අතුරින් පුරප්පාඩු පවතින ප්‍රමාණය මෙන් දෙගුණයක ප්‍රමාණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

විභාගය පැවැත්වෙන දිනය ඃ- ඉදිරියේදී දැනුම් දෙනු ලැබේ.

විභාග මාධ්‍ය ඃ- මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.

08. විෂය නිර්දේශය ඃ සාමාන්‍ය දැනීම / බුද්ධි පරීක්ෂණය සහ අලංකරණ උද්භිද විද්‍යාව / මූලික

උද්භිද විද්‍යාව / මල් හා විසිතුරු පැළ වගාව / පැළෑටි ප්‍රචාරණ හා උද්‍යාන නඩත්තු කිරීම.

09. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය* ඃ

තෝරාගනු ලබන අයදුම්කරුවන් සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය අධ්‍යක්ෂ ජනරාල්, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබේ. අයදුම්කරුගේ අතිරේක අධ්‍යාපන සුදුසුකම්, අතිරේක වෘත්තීය සුදුසුකම් , භාෂා ප්‍රාගුණ්‍ය , පළපුරුද්ද හා සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතා සඳහා උපරිම ලකුණු 100 ක් ලබා දෙනු ඇත.

ආචාර්ය ඩී.එස්.ඒ. විජේසුන්දර,
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව.

---

**උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය**

***ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව***

**ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවෙහි තනතුරක් වන උද්‍යාන වැඩ මූලික තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා අයදුම් පත්‍රය**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

1. විභාගය සඳහා භාෂා මාධ්‍යය ඃ සිංහල - 01
(අදාළ අංකය කොටුවේ ලියන්න) දෙමළ - 02

2. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(මහතා/මහත්මිය/මෙනවිය)

3. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :————.

5. ස්ථිර ලිපිනය :————.

6. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

7. 7.1 උපන් දිනය :————.

7.2 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :

අවුරුදු — මාස — දින

8. ස්ත්‍රී/පුරුෂ භාවය ඃ

0 - ස්ත්‍රී 1 - පුරුෂ

9. විවාහක/අවිවාහකභාවය :

1- අවිවාහක, 2 - විවාහක

10. ජන වර්ගය :

(සිංහල -1, දෙමළ -2, ඉන්දියානු දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් -5)

11. දුරකථන අංකය :————.

12. සුදුසුකම් :

12.1 අධ්‍යාපන සුදුසුකම් :-

අ.පො. ස. සාමාන්‍ය පෙළ විභාග තොරතුරු :

විභාගයට පෙනී සිටි වර්ෂය හා මාධ්‍යය :————.
විභාග අංකය :————.
විභාග ප්‍රතිඵල :————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

12.2 වෘත්තීය සුදුසුකම් :

ලබා ඇති වෘත්තීය සුදුසුකම - ..................................................
එය සම්පූර්ණ කළ දිනය - ..................................................
අදාල ආයතනය - ..................................................

12.3 වෙනත් සුදුසුකම් :————.

13. පළපුරුද්ද :————.

14. ඔබ යම් වරදකට කිසියම් අධිකරණයකින් දඬුවම් ලබා ඇත්ද? (ඇත්නම් කරුණු දක්වන්න) :————.

15. විභාග ගාස්තු ගෙවූ රිසිට්පත පිළිබඳ තොරතුරු :

(i) රිසිට්පතේ අංකය හා දිනය :————.

| රිසිට්පත නිසි පරිදි මෙහි අලවන්න.<br>(ඡායා පිටපතක් තමා සතුව තබා ගත යුතුය). |
|---|

16. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. තවද, මා රාජ්‍ය සේවයේ තනතුරකින් පහකරන ලද හෝ තනතුරක් හැරගිය පුද්ගලයෙකු නොවන බව ද ප්‍රකාශ කර සිටිමි. මෙම විභාගය සම්බන්ධයෙන් පවතින නීතිරීති වලට බැඳී සිටීමට හා විභාග නීති රෙගුලාසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනීගියහොත් විභාගය පැවැත්වීමට පෙර, විභාගය පැවැත්වීමේදී , ඉන්පසු හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීම සඳහා ගනු ලබන ඕනෑම තීරණයකට බැඳී සිටීමට මම එකඟ වෙමි. තවද, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විසින් පනවනු ලබන නීති හා රෙගුලාසි වලට එකඟ වන අතර, මෙම තනතුරෙහි පත්වීම සහ රාජකාරි ස්ථානය පිළිබඳ සියලු තීරණ ගැනීමේ අයිතිය එම අධ්‍යක්ෂ ජනරාල් සතුව පවතින බවද පිළිගනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

17. රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් සඳහා පමණයි.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය.**

මෙම ඉල්ලුම්කරු වන ...................... මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ ........... වශයෙන් ස්ථිර/ තාවකාලික නිළධාරියෙක් බව ද, ඔහුට/ඇයට මෙම පත්වීමේ රාජකාරිය ඉටු කිරීමට හැකියාව ඇති/ නොමැති බවද, සඳහන් කරමි. යම් හෙයකින් මෙම තනතුර සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ දැනට දරන තනතුරෙන් නිදහස් කිරීමට හැකියාව ඇති බවද සඳහන් කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව.

දිනය :————.
නම :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.

01-906

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ගුරු අධ්‍යාපනය පිළිබඳ පූර්ව සේවා වෘත්තීය පාඨමාලාවක් හැදෑරීම සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත් කර ගැනීම - 2014

1.0 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක ගුරු අධ්‍යාපනය පිළිබඳව තුන් අවුරුදු පූර්ව සේවා වෘත්තීය පාඨමාලාවක් හැදෑරීමට අවශ්‍ය ශාස්ත්‍රීය සුදුසුකම් හා යෝග්‍යතාවය ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 *යෝග්‍යතාවය* :

*සෑම අයදුම්කරුවකුම* -

2.1 ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය;

2.2 විශිෂ්ට චරිතයකින් ද, මනා ශාරීරික හා මානසික සෞඛ්‍යයෙන් ද යුක්ත විය යුතු ය;

2.3 *වයස* :

2.3.1 2014.01.01 වැනි දිනට වයස අවුරුදු 25ට නොවැඩි විය යුතු ය.

2.3.2 බුද්ධ ධර්මය පාඨමාලාවට ඉල්ලුම් කරන බෞද්ධ භික්ෂූන් වහන්සේලා/මෙහෙණින් වහන්සේලා 2014.01.01 වැනි දිනට වයස අවුරුදු 27ට නොවැඩි විය යුතු ය.

2.3.3 කතෝලික/ක්‍රිස්තියානි ධර්මය පාඨමාලාවට අයදුම්කරන පූජකවරුන් සඳහා 2014.01.01 වැනි දිනට වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

2.4 අවිවාහක විය යුතු ය.

3.0 *මූලික අධ්‍යාපන සුදුසුකම්* :

3.1 2012 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට වතු සේවකයන්ගේ දරුවන් පමණක් විෂයයන් දෙකකින්) එකවර සමත් වීම.

(තාක්‍ෂණ අධ්‍යයනය - ශිල්ප කලා පාඨමාලාවේ ඉල්ලුම්කරුවන් 4.23 ඡේදයේ සැලකිය යුතුයි යන වගන්තිය ද, නිර්මාණකරණය හා තාක්‍ෂණවේදය පාඨමාලාවේ ඉල්ලුම්කරුවන් 4.24 ඡේදයේ සැලකිය යුතුයි යන වගන්තිය ද, කතෝලික/ක්‍රිස්තියානි ධර්මය පාඨමාලාවේ පූජකවරුන් 4.8 සැලකිය යුතුයි යන වගන්තිය ද කියවන්න.)

3.2 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී/මූලික පිරිවෙන් අවසාන විභාගයේ දී ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුලුව හර විෂයයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සම්මාන තුනක් (03) සහිතව සමත්වීම. (පළමු අවස්ථාවේ දී අවම වශයෙන් හර විෂයයන් පහකින් (05) සමත් විය යුතු ය).

*හර විෂයයන්*.- (i) ආගම, (ii) පළමු බස, (iii) ඉංග්‍රීසි භාෂාව, (iv) ගණිතය, (v) ඉතිහාසය, (iv) විද්‍යාව හා තාක්‍ෂණවේදය, (vii) සෞන්දර්ය අධ්‍යයනය (චිත්‍ර, නැටුම්, සංගීතය, නාට්‍ය හා රංග කලාව, සාහිත්‍යය (සිංහල, දෙමළ, ඉංග්‍රීසි, අරාබි), (viii) තාක්‍ෂණ විෂයය (කෘෂිකර්මය, ව්‍යාපාර හා ගිණුම්කරණය, හස්ත කර්මාන්ත). හෝ 2008 අ. පො. ස. (සා. පෙළ) නව නිර්දේශයේ අයදුම්කරුවන් පළමු හා තෙවන විෂය කාණ්ඩ දෙකෙන් එක් විෂයයක්.

මූලික පිරිවෙන් අවසාන විභාගයේ අනිවාර්ය විෂයයන්.- (i) සිංහල, (ii) පාලි, (iii) සංස්කෘත, (iv) ඉංග්‍රීසි, (v) ගණිතය, (vi) ත්‍රිපිටක ධර්මය

3.3 ඒ ඒ පාඨමාලාවට අදාළ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ විශේෂ සුදුසුකම් ඉහත 3.2 පරිදි දෙවරක දී සම්පූර්ණ නොවේ නම් තුන්වැනි වාරයේ දී සම්පූර්ණ කර තිබිය යුතු ය. (විශේෂ සුදුසුකම් පිළිබඳව සලකා බලනු ලබන්නේ 3.1 හා 3.2 හි සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගේ පමණි.) විශේෂ සුදුසුකම් පිළිබඳව විශේෂයෙන් සඳහන් කර නොමැති විටෙක 3.1 හා 3.2 හි සඳහන් සුදුසුකම් සලකා බලනු ලැබේ.

3.4 *ඉංග්‍රීසි භාෂාව පාඨමාලාව හා ඉංග්‍රීසි මාධ්‍යය පාඨමාලා සඳහා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය* :

3.4.1. ඉංග්‍රීසි භාෂාව පාඨමාලාව හැර ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන අනෙකුත් පාඨමාලාවලට ඉල්ලුම් කරන අයදුම්කරුවන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතු වේ.

3.4.2 ඉංග්‍රීසි භාෂාව පාඨමාලාව සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු වේ. අ.පො.ස. (උ. පෙළ) ඉංග්‍රීසි භාෂාව විෂයයක් වශයෙන් සමත්ව ඇති අයදුම්කරුවන් අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම ප්‍රමාණවත් වේ. කෙසේ වුව ද ප්‍රවීණතා පරීක්ෂණයේ දී සමාන ලකුණක් ලබා ඇති අයදුම්කරුවන් කීප දෙනෙකු අතරින් එක් අයෙක් තෝරා ගැනීමට සිදුවන විටෙක දී පළමු වරට අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ලබාගත් ප්‍රතිඵල සැළකිල්ලට භාජනය කෙරේ. විශිෂ්ඨ සාමාර්ථයකට ලකුණු 04ක් ද, අධි සම්මාන සාමාර්ථයකට ලකුණු 03ක් ද, සම්මාන සාමාර්ථයකට ලකුණු 02ක් ද, සාමාන්‍ය සාමාර්ථයකට ලකුණු 01ක් ද, බැගින් ප්‍රදානය කොට සමස්ත ලකුණු සංඛ්‍යාව පදනම් කර ගනිමින් එක් එක් දිස්ත්‍රික්කයේ නියමිත පුරප්පාඩු සංඛ්‍යාව පුරවනු ලැබේ. මෙම ලකුණු දීම ප්‍රධාන විෂයයන් 08කට පමණක් සීමා කෙරේ. ප්‍රවීණතා හා අ. පො. ස. (සා. පෙළ)ට ලබා දෙන ලකුණ ද සමාන වන අවස්ථාවක එක් එක් දිස්ත්‍රික්කයේ Z අගය ප්‍රමුඛතා අනුපිළිවෙලට තෝරා ගනු ලැබේ.

3.4.3 තොරතුරු සන්නිවේදන තාක්ෂණය හා බටහිර සංගීතය යන පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වුව ද, සිංහල හා දෙමළ මාධ්‍යය පාසල්වල පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කොටගෙන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් අ.පො.ස. (උ.පෙළ) හැදෑරූ සිසුන් අතුරින් බඳවා ගනු ලැබේ.

3.4.4 චිත්‍ර/සංගීතය යන පාඨමාලා සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවන අයදුම්කරුවන්ට අදාළ වර්ෂයේ දී අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී අදාළ විෂයය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් පහත සඳහන් පරිදි ප්‍රදානය කෙරේ.

| | |
|---|---|
| A සාමාර්ථය සඳහා | 0.5 |
| B සාමාර්ථය සඳහා | 0.3 |
| C සාමාර්ථය සඳහා | 0.2 |
| S සාමාර්ථය සඳහා | 0.1 |

3.5 සුදුසුකම් තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරන සියලුම අධ්‍යාපන/වෘත්තීය සහතිකවල වලංගු දිනය ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර දිනයක් විය යුතු ය.

4.0 *අධ්‍යාපන සුදුසුකම් හා විශේෂ අවශ්‍යතා.*—ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පැවැත්වෙන එක් එක් පාඨමාලාවට අදාළ අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් විශේෂ අවශ්‍යතා පහත දැක්වේ :

4.1 පාඨමාලා අංකය 01 - ප්‍රාථමික අධ්‍යාපනය - (සිංහල)
ප්‍රාථමික අධ්‍යාපනය - (දෙමළ)

4.1.1 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ භාෂාව ඇතුලුව විෂයයන් තුනකින් (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට වතු සේවකයන්ගේ දරුවන් පමණක් සිංහල/දෙමළ භාෂාව ඇතුලුව විෂයයන් දෙකකින්) සමත්වීම;

*හා*

4.1.2 සිංහල/දෙමළ භාෂාව හා ගණිතය, ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයන් ඇතුලුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

*සැළකිය යුතුයි* :—

- ප්‍රාථමික අධ්‍යාපනය දෙමළ මාධ්‍යය පාඨමාලාව සඳහා අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි විෂයට සම්මාන සාමාර්ථයක් සහිත අයදුම්කරුවන් ඒ ඒ දිස්ත්‍රික්කවල ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් සලකා බලන අනෙකුත් සුදුසුකම් සමග අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් සහිත අයදුම්කරුවන් පිළිබඳව සලකා බලනු ලැබේ.

- දඹදෙණිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ප්‍රාථමික අධ්‍යාපනය පාඨමාලාව සඳහා අයදුම්කරන අයදුම්කරුවන් ප්‍රාථමික අධ්‍යාපනය පාඨමාලාව (සිංහල) සඳහා සලකා බලන සියලුම සුදුසුකම්වලට අමතරව බෞද්ධ ධර්මාචාර්ය විභාගය ද සමත් වී තිබිය යුතු ය. දඹදෙණිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව 60 කි.

- ප්‍රාථමික අධ්‍යාපනය පාඨමාලාව සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් එම පාඨමාලාව සඳහා තෝරා ගත හොත් ගුරු පත්වීම් ලද දින සිට ප්‍රාථමික ගුරුවරුන් ලෙස රජයේ පාසල්වල ප්‍රාථමික අංශයේ සේවය කිරීම අනිවාර්ය වේ. මෙසේ පත්වීම් ලබන සිංහල මාධ්‍යය ගුරුවරුන් හතර දෙනෙකු සහ දෙමළ මාධ්‍යය එක් අයෙකු කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහලේ ස්ථාපිත ප්‍රාථමික අධ්‍යාපන ඒකකයේ සේවයට වසරක කාල සීමාවකට අනුයුක්ත කෙරේ.

4.2 පාඨමාලා අංකය 02 - විද්‍යාව (සිංහල)
විද්‍යාව (දෙමළ)
විද්‍යාව (ඉංග්‍රීසි)

4.2.1 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන් තුනෙන් (03) (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට වතු සේවකයන්ගේ දරුවන් පමණක් ජීව විද්‍යාව විෂයය ඇතුලුව ඉහත විෂයයන් දෙකකින්) සමත්වීම ;

*හා*

4.2.2 සිංහල/දෙමළ භාෂාවට සාමාර්ථය හා ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ඇතුලුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

*සැළකිය යුතුයි* :—

- විද්‍යාව (ඉංග්‍රීසි මාධ්‍යය) පාඨමාලාව සඳහා—

  (i) අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී 4.2.1 හා 4.2.2 සුදුසුකම් සපුරා ඉංග්‍රීසි මාධ්‍යයෙන් අ. පො. ස. (උ. පෙළ) පාඨමාලාව හදාරා ඇති එක් එක් දිස්ත්‍රික්කවල අයදුම්කරුවන් අතුරින් 50% ද ;

(ii) අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී 4.2.1 හා 4.2.2 සුදුසුකම් සපුරා සිංහල/දෙමළ මාධ්‍යයෙන් අ. පො. ස. (උ. පෙළ) පාඨමාලාව හදාරා ඇති එක් එක් දිස්ත්‍රික්කවල අයදුම්කරුවන් අතුරින් 50% ද තෝරා ගනු ලැබේ. (i) වගන්තිය යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම පුරප්පාඩු (ii) වගන්තිය යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කෙරේ.

4.3 පාඨමාලා අංකය 03 - ගණිතය (සිංහල)
ගණිතය (දෙමළ)
ගණිතය (ඉංග්‍රීසි)

4.3.1 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ගණිතය, සංයුක්ත ගණිතය, උසස් ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් විෂයයන් තුනකින් (03) (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට වතු සේවකයන්ගේ දරුවන් පමණක් ගණිතය විෂයය ධාරාවට අයත් ගණිතය, සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය යන විෂයයන් එකක් සහිතව ඉහත විෂයයන් දෙකකින්) සමත්වීම.

*හා*

4.3.2 සිංහල/දෙමළ භාෂාවට සාමාර්ථය හා විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් ඇතුලුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

*සැළකිය යුතුයි* :—

* *ගණිතය (ඉංග්‍රීසි මාධ්‍යය) පාඨමාලාව සඳහා*

(i) අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී 4.3.1 හා 4.3.2 සුදුසුකම් සපුරා ඉංග්‍රීසි මාධ්‍යයෙන් අ. පො. ස. (උ. පෙළ) පාඨමාලාව හදාරා ඇති එක් එක් දිස්ත්‍රික්කවල අයදුම්කරුවන් අතුරින් 50% ද ;

(ii) අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී 4.3.1 හා 4.3.2 සුදුසුකම් සපුරා සිංහල/දෙමළ මාධ්‍යයෙන් අ. පො. ස. (උ. පෙළ) පාඨමාලාව හදාරා ඇති එක් එක් දිස්ත්‍රික්කවල අයදුම්කරුවන් අතුරින් 50% ද තෝරා ගනු ලැබේ. (i) වගන්තිය යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම පුරප්පාඩු (ii) වගන්තිය යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කෙරේ.

4.5 *පාඨමාලා අංකය 05 - බුද්ධ ධර්මය* :

බුද්ධ ධර්මය පාඨමාලාවට බෞද්ධ භික්ෂූන් වහන්සේලාට ද, මෙහෙණින් වහන්සේලාට ද, ඉල්ලුම් කළ හැකි ය.

4.5.1 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ඨාචාරය, පාලි හා සිංහල යන විෂයයන්ගෙන් දෙකක් ඇතුළුව විෂයයන් තුනකින් සමත්වීම.
4.5.2 ප්‍රාචීන, ප්‍රාරම්භ විභාගයෙන් සමත්වීම.
4.5.3 බෞද්ධ ධර්මාචාර්ය විභාගයෙන් සමත්වීම.
4.5.4 දහම් පාසල් අවසාන විභාගයෙන් සමත්වීම.
4.5..5 සිංහල භාෂාව, බුද්ධ ධර්මය හා ගණිතය ඇතුලුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ)/සිංහල භාෂාව, ගණිතය, ත්‍රිපිටක ධර්මය ඇතුලු අනිවාර්ය විෂයයන් හයෙන් (06) මූලික පිරිවෙන් අවසාන විභාගයෙන් සමත්වීම.

*සැළකිය යුතුයි* :-

(i) *තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල* :

(අ) 4.5.1, 4.5.2, 4.5.3, 4.5.4, 4.5.5 යන සියලුම සහතික ඇති අයදුම්කරුවන්.
(ආ) 4.5.1, 4.5.2 සහ 4.5.5 සහතික ඇති අයදුම්කරුවන්.
(ඉ) 4.5.1, 4.5.3 සහ 4.5.5 සහතික ඇති අයදුම්කරුවන්.
(ඊ) 4.5.1, 4.5.4 සහ 4.5.5 සහතික ඇති අයදුම්කරුවන්.
(උ) 4.5.1 සහ 4.5.5 සහතික ඇති අයදුම්කරුවන්.

4.6 පාඨමාලා අංකය 06 - හින්දු ධර්මය

4.6.1 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී හින්දු ධර්මය, හින්දු ශිෂ්ටාචාරය හා සංස්කෘත යන විෂයයන්ගෙන් එකක් ඇතුලුව විෂයයන් තුනකින් සමත්වීම.
4.6.2 ශෛව සිද්ධාන්ත පණ්ඩිතර් සහතිකය ලබා තිබීම.
4.6.3 ශෛව පුලවර් සහතිකය ලබා තිබීම.
4.6.4 ඉලං ශෛව පුලවර් සහතිකය ලබා තිබීම.
4.6.5 දෙමළ භාෂාව, ගණිතය සහ හින්දු ධර්මය ඇතුලුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම.

*සැළකිය යුතුයි.—තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල*

(අ) 4.6.1, 4.6.5 සහ අනිකුත් සියලුම සහතික හිමි අයදුම්කරුවන්.
(ආ) 4.6.1, 4.6.4, 4.6.5 සහ අනිකුත් සහතික දෙකෙන් එකක් ලැබූ අයදුම්කරුවන්.
(ඉ) 4.6.1, 4.6.5 සහ අනිකුත් සහතික තුනෙන් එකක් ලැබූ අයදුම්කරුවන්.
(ඊ) 4.6.1, 4.6.5. සහතික ලැබූ අයදුම්කරුවන්.

4.7 *පාඨමාලා අංකය 07 - ඉස්ලාම් ධර්මය*

4.7.1 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඉස්ලාම් ධර්මය, ඉස්ලාම් ශිෂ්ටාචාරය හා අරාබි යන විෂයයන්ගෙන් විෂයය එකක් ඇතුළුව විෂයයන් තුනකින් සමත්වීම.

4.7.2 අල්-ආලීම් විභාගය (ප්‍රාථමික විභාගයේ සියලුම විෂයයන්ගෙන් හා අවසාන විභාගයේ සියලුම විෂයයන්ගෙන් යන දෙකෙන්ම) සමත්වීම.

4.7.3 අල් - ආලීම් ප්‍රාථමික විභාගයේ සියලුම විෂයයන්ගෙන් සමත්වීම.

4.7.4 මෞලවි සහතිකය ලබා තිබීම.

4.7.5 දෙමළ භාෂාව, ගණිතය සහ ඉස්ලාම් ධර්මය ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම.

*සැළකිය යුතුයි* :—

*තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල* :-

(අ) 4.7.1, 4.7.2, 4.7.3, 4.7.4 සහ 4.7.5 සහතික හිමි අයදුම්කරුවන්,

(ආ) 4.7.1, 4.7.3, 4.7.4 සහ 4.7.5 සහතික හිමි අයදුම්කරුවන්,

(ඉ) 4.7.1, 4.7.4 සහ 4.7.5 සහතික හිමි අයදුම්කරුවන්,

(ඊ) 4.7.1 සහ 4.7.5 සහතික හිමි අයදුම්කරුවන්,

4.8 පාඨමාලා අංකය 08 - කතෝලික ධර්මය/ක්‍රිස්තියානි ධර්මය (සිංහල)
කතෝලික ධර්මය/ක්‍රිස්තියානි ධර්මය (දෙමළ)

4.8.1 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් සමත්වීම ;

*හා*

සිංහල/දෙමළ භාෂාව, ගණිතය සාමාර්ථය ද ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම ;

*හා*

අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ක්‍රිස්තු ධර්මය/ක්‍රිස්තියානි ධර්මය/ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් හෝ අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් කතෝලික ධර්මය/ක්‍රිස්තියානි ධර්මය විෂයයට සම්මාන සාමාර්ථයක් ;

*හා*

අයදුම්කරු කතෝලික ධර්මය/ක්‍රිස්තියානි ධර්මය ගුරුවරයෙකු වීමට සුදුසු බවට කතෝලික ආගමිකයන් සඳහා කතෝලික රදගුරු පදවි සහතිකය ද ක්‍රිස්තියානි ආගමිකයන් සඳහා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ සහතිකය ද ලබා තිබීම.

4.8.2 කතෝලික ධර්මය අයැදුම්කරුවන් තෝරා ගැනීම පහත දැක්වෙන සුදුසුකම්වලට අනුපිළිවෙලින් ප්‍රමුඛත්වය දී සිදුකරනු ලැබේ. :—

4.8.2.1 ජාතික දෙව්සත්හලේ දේව ධර්මය පිළිබඳ සිව් අවුරුදු පාඨමාලා සහතිකය ;

*හෝ*

4.8.2.2 ජාතික දෙව්සත්හලේ දර්ශනවාදය පිළිබඳ පාඨමාලා සහතිකය ;

*හෝ*

4.8.2.3 දේව ධර්ම නිකේතනයේ තුන් අවුරුදු ආගමික අධ්‍යයන පාඨමාලා සහතිකය ;

*හෝ*

4.8.2.4 පැවිදිවරයෙකු/පැවිදිවරියක වීම සඳහා ආගමික අධ්‍යයන සහ පුහුණු පාඨමාලාව (නොවිෂියේට්) පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කළ බවට පැවිදි නිකායන්ගේ ශ්‍රේෂ්ඨාධිපති/ශ්‍රේෂ්ඨාධිපතිනිය හෝ අදාළ රදගුරුතුමන් විසින් නිකුත් කරන ලද සහතිකය ;

*හෝ*

4.8.2.5 ජාතික ධර්මෝපදේශක මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන කතෝලික ධර්මාචාර්ය (දහම් ගුරු) විභාගයක් සමත්වීම;
එනම්

ධර්මාචාර්ය ගෞරව (දහම් ගුරු 03) ;

*හෝ*

ධර්මාචාර්ය විශේෂ (දහම් ගුරු 02) ;

*හෝ*

ධර්මාචාර්ය සාමාන්‍ය (දහම් ගුරු 1) ;

*හෝ*

4.8.2.6 අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ක්‍රිස්තු ධර්මය/ක්‍රිස්තියානි ධර්මය/ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය විෂයය සමත්වීම.

4.8.3 ක්‍රිස්තු ධර්මය අයැදුම්කරුවන් තෝරාගැනීම අනුපිළිවෙලින් පහත දැක්වෙන සුදුසුකම් අනුව සිදුකරනු ලැබේ :-

4.8.3.1 පිළිමතලාව ලංකා දේව ධර්ම ශාස්ත්‍රාලය මගින් පවත්වනු ලබන ධර්මවේ දී ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

4.8.3.2 ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය මගින් පවත්වනු ලබන ආගමික දැනුම පිළිබඳ ජාතික සහතිකය (ධර්මාචාර්ය) ලබා තිබීම.

*සැලකිය යුතුයි -*

* 2017 වසර සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල කතෝලික ධර්මය/ක්‍රිස්තියානි ධර්මය පාඨමාලාවට තෝරා ගැනීමේ දී 4.8.2 යටතේ දැක්වෙන සුදුසුකම්වලට අමතරව ඇක්වයිනස් උසස් අධ්‍යාපන ආයතනයේ තුන් අවුරුදු ආගමික අධ්‍යයන පාඨමාලා සහතිකය සහ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වන කතෝලික දහම් පාසල් අවසාන විභාග සහතිකය සලකා බලනු ලැබේ.

(i) බඳවා ගන්නා මුළු සංඛ්‍යාවෙන් 85% ක් තෝරා ගැනීම සඳහා 4.8.1 යටතේ සුදුසුකම් ලබන කතෝලික අයැදුම්කරුවන් අතරින් 4.8.2 යටතේ දැක්වෙන අනුපිළිවෙළ අනුව තෝරා ගනු ලැබේ. 85% කතෝලික අයැදුම්කරුවන් ඉදිරිපත්වී නොමැති නම් එම පුරප්පාඩු සඳහා ක්‍රිස්තියානි අයැදුම්කරුවන් තෝරාගනු ලැබේ.

(ii) බඳවා ගන්නා මුළු සංඛ්‍යාවෙන් 15% ක් 4.8.1 යටතේ සුදුසුකම් ලබන ක්‍රිස්තු ධර්මය අයැදුම්කරුවන් අතරින් 4.8.3 යටතේ දැක්වෙන අනුපිළිවෙල අනුව තෝරා ගනු ලැබේ. 15% ක් ක්‍රිස්තියානි අයැදුම්කරුවන් ඉදිරිපත්වී නොමැති නම් එම පුරප්පාඩු සඳහා කතෝලික අයැදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

(iii) බඳවා ගන්නා මුළු අයැදුම්කරුවන් සංඛ්‍යාවෙන් 40%ක් කතෝලික හා ක්‍රිස්තියානි පූජක පක්ෂයෙන් තෝරා ගනු ලැබේ. 40% ක පූජක පක්ෂයේ අයැදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් වී නොමැති නම් එම පුරප්පාඩු සඳහා ගිහි අයැදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

(iv) පූජක පක්ෂයේ අයැදුම්කරුවන් අතර 2012 වර්ෂයේ අ. පො. ස. (උ.පෙළ) සමත් වූ අයැදුම්කරුවන් අවශ්‍ය සංඛ්‍යාව නොමැති නම් 2011, 2010, 2009, 2008 සහ 2007 යන අනුපිළිවෙලින් ආසන්නතම වර්ෂ සලකා අ. පො. ස. (උ.පෙළ) සමත් වූ පූජක/පැවිදි පක්ෂයේ අයැදුම්කරුවන්ගෙන් තෝරා ගනු ලැබේ.

**4.9 පාඨමාලා අංකය 09 - පළමු බස (සිංහල)**

4.9.1 2011 වර්ෂයේ දී පවත්වන ලද අ.පො. ස. (උ. පෙළ) විභාගයේ දී සිංහල විෂයයට සම්මාන සාමාර්ථයක් ඇතුළුව විෂයයන් තුනකින් (03) සමත් වීම;

*හා*

4.9.2 සිංහල භාෂාවට සම්මාන සාමාර්ථයක් හා ගණිතය ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

**4.10 පාඨමාලා අංකය 10 - පළමු බස (දෙමළ)**

4.10.1 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී දෙමළ විෂයයට සම්මාන සාමාර්ථයක් ඇතුළුව විෂයයන් තුනකින් (03) (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට වතුසේවක දරුවන් පමණක් දෙමළ විෂයය ඇතුළුව විෂයයන් දෙකකින්, අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී දෙමළ විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමිවේ.) සමත් වීම;

*හා*

4.10.2 දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් හා ගණිතය ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.11 පාඨමාලා අංකය 11 - ඉංග්‍රීසි

4.11.1 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව (සාමාන්‍ය ඉංග්‍රීසි නොවේ) ඇතුළුව විෂයයන් තුනකින් සමත්වීම හා අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ද, සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන්/ලන්ඩන් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම ;

*හෝ*

4.11.2 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් සමත්වීම හා අ. පො. ස. (සා. පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් හා සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ.) විභාගය සමත්වීම ;

*සැළකිය යුතුයි* :-

(i) ඉංග්‍රීසි පාඨමාලාවට තෝරා ගැනීමේ දී ඒ ඒ දිස්ත්‍රික්කවල 4.11.1 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමිවේ. (ඔවුන් 6.1.2 ඡේදයට අනුව තෝරා ගනු ලැබේ.) ඔවුන් ප්‍රවීණතා පරීක්ෂණයට පෙනී සිටිය යුතු නැත. සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසුකම් තහවුරු කළ යුතු ය. 4.11.2 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන් ප්‍රවීණතා පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

(ii) 4.11.1 යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් පමණක් 4.11.2 යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් පිළිබඳ සලකා බලනු ලැබේ. යම් දිස්ත්‍රික්කයක 4.11.1 යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටියහොත් ප්‍රවීණතා පරීක්ෂණයේ අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

4.13 පාඨමාලා අංකය 13 - චිත්‍ර (සිංහල)
චිත්‍ර (දෙමළ)

4.13.1 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී චිත්‍රකලා විෂයය ඇතුළුව විෂයයන් තුනකින් (03) සමත් වීම ;

*හා*

4.13.2 සිංහල/දෙමළ භාෂාව, ගණිතය හා චිත්‍ර ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.13.3 2012 වර්ෂයේ දී අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී චිත්‍ර/චිත්‍ර හා මූර්ති විෂයය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් 3.4.4 හි සඳහන් පරිදි ප්‍රදානය කරනු ලැබේ.

4.17 පාඨමාලා අංකය 17 - සංගීතය (කර්ණාට)

4.17.1 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී කර්ණාට සංගීතය ඇතුළුව විෂයයන් තුනකින් (3) (ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට වතු සේවක දරුවන් පමණක් කර්ණාට සංගීතය විෂය ඇතුළුව විෂයයන් දෙකකින්) සමත්වීම;

*හා*

4.17.2 දෙමළ භාෂාව, ගණිතය හා කර්ණාට සංගීතය ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

4.17.3 2012 වසරේ දී අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී සංගීතය (කර්ණාට) විෂයය සඳහා ලබා ඇති ශ්‍රේණිය මත අතිරේක ලකුණක් 3.4.4හි සඳහන් පරිදි ප්‍රදානය කරනු ලැබේ.

*සැළකිය යුතුයි* :

(ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී කර්ණාට සංගීතය විෂයය ඇතුළුව විෂයයන් තුනකින් (03) සමත් වතු දිස්ත්‍රික්කවල පදිංචි වතු සේවකයන්ගේ දරුවන් නොවන ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ මාධ්‍ය අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය හිමි වේ. තවදුරටත් පුරප්පාඩු පවතී නම් වතු සේවක දරුවන්, 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී එකවර විෂයයන් දෙකකින් සමත්ව අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී කර්ණාට සංගීතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා ඇති ඉල්ලුම්පත්‍ර සළකා බලනු ලැබේ.)

4.18 පාඨමාලා අංකය 18 - බටහිර සංගීතය (ඉංග්‍රීසි)

4.18.1 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී බටහිර සංගීතය ඇතුළුව විෂයයන් තුනකින් සමත්වීම ;

*හා*

ඉංග්‍රීසි භාෂාව සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයය සාමාන්‍ය සාමාර්ථයක් ද සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ බටහිර සංගීතය ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම ;

*හෝ*

4.18.2 2011 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් සමත් වීම ;

*හා*

ඉංග්‍රීසි භාෂාව සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයය සාමාන්‍ය සාමාර්ථයක් ද සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ බටහිර සංගීතය ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම ;

*හා*

අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනයක බටහිර සංගීතය පිළිබඳව පස්වැනි පන්තිය සමත්වීම (න්‍යායික හා ප්‍රායෝගික) ;

*හෝ*

අ. පො. ස. (උ. පෙළ) බටහිර සංගීතය විෂයය අමතර විෂයයක් ලෙස සමත්ව තිබීම.

*සැළකිය යුතුයි* :-

(i) බටහිර සංගීතය පාඨමාලාව සඳහා පවත්වන ප්‍රායෝගික පරීක්‍ෂණයේ දී සතුටුදායක කුසලතා මට්ටමකට ළඟාවීම.

(ii) එම පාඨමාලාවට තෝරා ගැනීමේ දී ඉහත 4.18.1 යටතේ සුදුසුකම් සපුරාලූ අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

4.20 පාඨමාලා අංකය 20 - ශාරීරික අධ්‍යාපනය (සිංහල)
ශාරීරික අධ්‍යාපනය (දෙමළ)
ශාරීරික අධ්‍යාපනය (ඉංග්‍රීසි)

4.20.1 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් සමත්වීම;

*හා*

4.20.2 සිංහල/දෙමළ භාෂාව, සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය හා ගණිතය ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස (සා. පෙළ) විභාගයෙන් සමත්වීම;

*හා*

4.20.3 පිළිගත්, ජවන හා පිටිය මළල ක්‍රීඩා සංවිධානාත්මක ක්‍රීඩා පිළිබඳ ප්‍රවීණතාවයක්/දක්‍ෂතාවයක් ලබා තිබීම, විවිධ ක්‍රීඩා/ඉසව් තුනකට උපරිම වශයෙන් ලකුණු 75ක් ප්‍රදානය කිරීම පහත දැක්වෙන අනුපිළිවෙලට සිදුකරනු ලැබේ.

*ක්‍රීඩා/ඉසව් ප්‍රමුඛතා අනුපිළිවෙල*

| *අනු. අංකය* | *මට්ටම/විෂය* | *කේවල* | *සමූහ* | *ස්ථානය/ ශ්‍රේණිය* | *ලකුණු* |
|---|---|---|---|---|---|
| 1 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 1 | 25 |
| 2 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 2 | 24 |
| 3 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 3 | 23 |
| 4 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 1 | 22 |
| 5 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 2 | 21 |
| 6 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 3 | 20 |
| 7 | අන්තර් ජාතික නියෝජනය | කේවල | සමූහ | - | 19 |
| 8 | ජාතික මට්ටම | කේවල | - | 1 | 18 |
| 9 | ජාතික මට්ටම | කේවල | - | 2 | 17 |
| 10 | ජාතික මට්ටම | කේවල | - | 3 | 16 |
| 11 | ජාතික මට්ටම | - | සමූහ | 1 | 15 |
| 12 | ජාතික මට්ටම | - | සමූහ | 2 | 14 |
| 13 | ජාතික මට්ටම | - | සමූහ | 3 | 13 |
| 14 | පළාත් මට්ටම | කේවල | - | 1 | 12 |
| 15 | පළාත් මට්ටම | කේවල | - | 2 | 11 |
| 16 | පළාත් මට්ටම | කේවල | - | 3 | 10 |
| 17 | පළාත් මට්ටම | - | සමූහ | 1 | 09 |
| 18 | පළාත් මට්ටම | - | සමූහ | 2 | 08 |
| 19 | පළාත් මට්ටම | - | සමූහ | 3 | 07 |
| 20 | රෙජිමේන්තු සැරයන් මේජර්/ බලලත් නිලධාරි 1 | - | - | - | 06 |
| 21 | ජනාධිපති බාලදක්ෂ/බාලදක්ෂිකා | - | - | - | 06 |
| 22 | සාජන්ට් මේජර්/බලලත් නිලධාරි 2 | - | - | - | 05 |
| 23 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | කේවල | - | 1 | 06 |
| 24 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | කේවල | - | 2 | 05 |
| 25 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | කේවල | - | 3 | 04 |
| 26 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | - | සමූහ | 1 | 03 |
| 27 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | - | සමූහ | 2 | 02 |
| 28 | දිස්ත්‍රික් මට්ටම/කලාප/ප්‍රා. ලේ. කාර්යාල | - | සමූහ | 3 | 01 |

4.20.4 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය විෂයයට ඔවුන් ලබා ඇති සාමාර්ථයන් අනුව අතිරේක ලකුණු හිමි වේ :

A සාමාර්ථය - 05
B සාමාර්ථය - 03
C සාමාර්ථය - 02
S සාමාර්ථය - 01

*සැළකිය යුතුයි :—*

(i) *පිළිගත් ක්‍රීඩා තරග (අන්තර් ජාතික).* - අධ්‍යාපන අමාත්‍යාංශය/ක්‍රීඩා අමාත්‍යාංශය සහ ඒවායේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම් මගින් (චෙස්, කැරම්,දාම් හැර) ශ්‍රී ලංකාවේ ජාතික කණ්ඩායම් හෝ පාසල් ජාතික ක්‍රීඩා කණ්ඩායම් නියෝජනය කරමින් සහභාගී වන අන්තර් ජාතික තරග (පාසැල් ක්‍රීඩා කණ්ඩායම් පෞද්ගලිකව සහභාගි වන අන්තර් ජාතික තරග සලකා නොබැලේ.).

(ii) *පිළිගත් ක්‍රීඩා තරග.-* අධ්‍යාපන අමාත්‍යාංශය/ක්‍රීඩා අමාත්‍යාංශය/ජාතික තරුණ සේවා සභාව මඟින් සංවිධානය කරනු ලබන ජාතික මට්ටමේ ක්‍රීඩා තරග.

පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය/ජාතික තරුණ සේවා සභාව මඟින් සංවිධානය කරනු ලබන පළාත් මට්ටමේ ක්‍රීඩා තරග.

පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය/ජාතික තරුණ සේවා සභාව මඟින් සංවිධානය කරනු ලබන දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩා තරග/පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලබන අධ්‍යාපන කලාප මට්ටමේ ක්‍රීඩා තරග.

(iii) ක්‍රීඩා අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි හා පිළිගත් ක්‍රීඩා සංගම් මගින් සංවිධානය කරන ලද ඒ ශ්‍රේණියේ තරගවල 1,2 හා 3 වැනි ස්ථානවලට පමණක් අනුපිළිවෙලින් ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

(iv) ඉල්ලුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනයට පූර්වයෙන් වූ වර්ෂ පහ (05) තුළ ලබාගත් ක්‍රීඩා ප්‍රවීණතාවයක්/දක්ෂතාවයක් මේ සඳහා වලංගු වේ.

(v) ක්‍රීඩා සහතික තුනකට ලකුණු දීමේ දී ලකුණු හිමි වන්නේ එකම ඉසව්වකට එකම වසරක දී ලබාගත් සහතිකවලින් එක් ඉහළම සහතිකයකට පමණි.

4.21 පාඨමාලා අංකය 21 - ගෘහ ආර්ථික විද්‍යාව (සිංහල)
ගෘහ ආර්ථික විද්‍යාව (දෙමළ)

4.21.1 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ගෘහ ආර්ථික විද්‍යාව ඇතුළුව විෂයයන් තුනකින් (03) සමත්වීම;

*හා*

4.21.2 විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව සිංහල/දෙමළ භාෂාව, ගණිතය ද ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

4.22 පාඨමාලා අංකය 22 - කෘෂි හා ආහාර තාක්‍ෂණය (සිංහල)
කෘෂි හා ආහාර තාක්‍ෂණය (දෙමළ)

4.22.1 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් තුනෙන් (03) සමත්වීම;

*හා*

ගණිතය සහ විද්‍යාව යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව සිංහල/දෙමළ භාෂාව ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.22.2 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී කෘෂිකර්මය/කෘෂි තාක්‍ෂණවේදය/ජෛව සම්පත් තාක්‍ෂණවේදය/ආහාර තාක්‍ෂණවේදය විෂයය ඇතුළුව විෂයයන් තුනකින් (03) සමත්වීම;

*හා*

ගණිතය, විද්‍යාව සහ කෘෂිකර්මය/කෘෂි හා ආහාර තාක්‍ෂණය යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයන් සහිතව සිංහල/දෙමළ භාෂාව ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

*සැළකිය යුතුයි* :-

*තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල* :

(අ) 4.22.1 සුදුසුකම සහ රජයේ පිළිගත් කෘෂිකර්ම විද්‍යාලයක වසරක් හෝ ඊට වඩා වැඩි කෘෂිකර්ම පාඨමාලාවක් හදාරා සාර්ථක ලෙස නිම කර සහතිකයක් ලබා ඇති අයදුම්කරුවන්;

(ආ) 4.22.1 සුදුසුකම හිමි අයදුම්කරුවන්;

(ඉ) 4.22.2 සුදුසුකම හිමි අයදුම්කරුවන්.

4.23 පාඨමාලා අංකය 23 - තාක්‍ෂණ අධ්‍යයනය - ශිල්ප කලා (සිංහල)
තාක්‍ෂණ අධ්‍යයනය - ශිල්ප කලා (දෙමළ)

4.23.1 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් (03) සමත් වීම ;

*හා*

4.23.2 ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව, ශිල්ප කලා /කලා ශිල්ප ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම;

*හා*

4.23.3 රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක/ජාතික ආධුනිකත්ව මණ්ඩලය/වෘත්තීය පුහුණු අධිකාරිය/පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව/කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව/වෙනත් මධ්‍යම රජයේ හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක් යටතේ හෝ පාලනය වන ආයතනයක් මගින් පවත්වන, විෂය සාධන මට්ටම දැක්වෙන විධිමත් සහතික නිකුත් කරනු ලබන මාස දහයකට (10) නොඅඩු විෂයය ක්‍ෂේත්‍රයට අදාළ ශිල්පීය පාඨමාලාවක් හදාරා සාර්ථකව නිමකර තිබීම.

*සැළකිය යුතුයි* :-

(i) *තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල* :

(අ) 4.23.1, 4.23.2 හා 4.23.3 සහතික ඇති අයදුම්කරුවන්;

(ආ) 4.23.1. හා 4.23.2 සහතික ඇති අයදුම්කරුවන්.

ඉහත (අ) හි සඳහන් සුදුසුකම් සපුරාලූ අයැදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඉදිරිපත් වී නොමැති නම් 2011 සහ 2010 වසරවල දී (අ) සුදුසුකම් ලද අයදුම්කරුවන් පිළිවෙලින් සළකා බැලේ. තවදුරටත් පුරප්පාඩු පැවතියහොත් පමණක් ඉහත (ආ) හි සුදුසුකම් සපුරාලූ අයදුම්කරුවන් 2012, 2011, 2010 ප්‍රමුඛතා අනුපිළිවෙලින් බඳවා ගැනීම සඳහා සළකා බැලේ.

(ii) ඉල්ලුම්පත්‍රයේ අංක 16.1 යටතේ ඉල්ලුම් කරන විෂය ක්‍ෂේත්‍රය ශිල්ප කලා යන්න පැහැදිලිව සටහන් කළ යුතු ය.

(iii) ඉල්ලුම්පත්‍ර කැඳවීමේ අවසාන දිනට හෝ ඊට පෙර ඉහත දැක්වෙන සියලු අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතු ය.

**4.24 පාඨමාලා අංකය 24 - නිර්මාණකරණය හා තාක්‍ෂණවේදය (සිංහල)**
**නිර්මාණකරණය හා තාක්‍ෂණවේදය (දෙමළ)**

4.24.1 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී තාක්‍ෂණවේදය විෂය මාලාවට අයත් දෘඪ තාක්‍ෂණවේදය සංරචකයට අයත් සිවිල් තාක්‍ෂණවේදය, යාන්ත්‍රික තාක්‍ෂණවේදය, විදුලිය හා ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්‍ෂණවේදය යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව විෂයයන් තුනකින් (03) සමත්වීම ;

*හෝ*

4.24.2 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් (03) සමත්වීම ;

*හා*

4.24.3 ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ද, ඉදිකිරීම් තාක්‍ෂණය,/යාන්ත්‍රික තාක්‍ෂණය/විදුලි හා ඉලෙක්ට්‍රොනික තාක්‍ෂණය /නිර්මාණකරණය හා තාක්‍ෂණවේදය යන විෂයයන්ගෙන් එකක් ද ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම;

හා

4.24.4 රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක/ජාතික ආධුනිකත්ව මණ්ඩලය/වෘත්තීය පුහුණු අධිකාරිය/කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව/වෙනත් මධ්‍යම රජයේ හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක් යටතේ හෝ පාලනය වන ආයතනයක් මගින් පවත්වන, විෂය සාධන මට්ටම දැක්වෙන විධිමත් සහතික නිකුත් කරනු ලබන මාස දහයකට (10) නොඅඩු විෂයය ක්ෂේත්‍රයට අදාළ ශිල්පීය පාඨමාලාවක් හදාරා සාර්ථකව නිමකර තිබීම.

*සැලකිය යුතුයි :-*

(i) තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල ඃ

(අ) 4.24.1 හා 4.24.3 සහතික ඇති අයදුම්කරුවන්;
(ආ) 4.24.2, 4.24.3 හා 4.24.4 සහතික ඇති අයදුම්කරුවන්.

එසේ වුව ද ඉහත (අ), (ආ) හි සඳහන් සුදුසුකම් සපුරාලු අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඉදිරිපත් වී නොමැති නම් 2011 සහ 2010 වසරවල දී (අ) හෝ (ආ) සුදුසුකම් ලද අයැදුම්කරුවන් පිළිවෙලින් සලකා බැලේ.

* 2015 වසර සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල නිර්මාණකරණය හා තාක්‍ෂණවේදය පාඨමාලාවට 4.24.1 යටතේ අයදුම් කිරීමට අපේක්‍ෂා කරන අයදුම්කරුවන් ද 4.24.4 යටතේ දක්වා ඇති මාස දහයකට (10) නොඅඩු පුහුණු පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

(ii) ඉල්ලුම් පත්‍රයේ අංක 16.1 යටතේ ඉල්ලුම් කරන විෂය ක්‍ෂේත්‍රය නිර්මාණකරණය හා තාක්‍ෂණවේදය යන්න පැහැදිලිව සටහන් කළ යුතුය.

(iii) ඉල්ලුම් පත්‍ර කැඳවීමේ අවසාන දිනට හෝ ඊට පෙර ඉහත දැක්වෙන සියලු අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතුය.

**4.25 පාඨමාලා අංකය 25 - තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ඉංග්‍රීසි)**

4.25.1 2012 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ විෂය ඇතුළුව විෂයයන් තුනකින් (03) (වතු සේවකයන්ගේ දරුවන් පමණක් තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ විෂය ඇතුළුව විෂයයන් දෙකකින්) සමත් වීම ;

*හා*

ඉංග්‍රීසි භාෂාව සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයය සාමාන්‍ය සාමාර්ථයක් සහ තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ විෂය, සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ද ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

හෝ

4.25.2 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් (03) (වතු සේවකයන්ගේ දරුවන් පමණක් විෂයයන් දෙකකින්) සමත්වීම.

හා

ඉංග්‍රීසි භාෂාව සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයය සාමාන්‍ය සාමාර්ථයක් සහ ගණිතයට සම්මාන සාමාර්ථයක් සහිතව සිංහල/දෙමළ භාෂාව ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

*සැලකිය යුතුයි :*

(i) තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය පාඨමාලාවට තෝරා ගැනීමේ දී ඒ ඒ දිස්ත්‍රික්කවල 4.25.1 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමි වේ. (ඔවුන් 6.1.2 ඡේදයට අනුව තෝර ගනු ලැබේ.) ඔවුන් ප්‍රවීණතා පරීක්‍ෂණයට පෙනී සිටිය යුතු නැත. සම්මුඛ පරීක්‍ෂණයේ දී සුදුසුකම් තහවුරු කළ යුතුය. 4.25.2 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන් ප්‍රවීණතා පරීක්‍ෂණයට පෙනී සිටිය යුතුය.

(ii) 4.25.1 යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් පමණක් 4.25.2 යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් පිළිබඳ සලකා බලනු ලැබේ. යම් දිස්ත්‍රික්කයක 4.25.1 යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටියහොත් ප්‍රවීණතා පරීක්‍ෂණයේ අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

(iii) ප්‍රවීණතා පරීක්‍ෂණයේ ප්‍රශ්න පත්‍රය වාස්තවික වර්ගයේ ප්‍රශ්න වලින් යුක්ත පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයකි. මෙමඟින්, තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය පාඨමාලාව හැදෑරීම සඳහා අවශ්‍ය වන මූලික ගණිත සංකල්ප සම්බන්ධයෙන් අපේක්‍ෂකයන්ගේ නිපුණතාව මැන බැලීම සිදු කෙරේ.

(iv) තෝරාගැනීමේ පරීක්ෂණයට සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන ඕනෑම මාධ්‍යයකින් පෙනී සිටිය හැකිය.

(v) තෝරාගැනීමේ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය අයදුම්පත්‍රයේ 1.0 ඡේදයේ (මාධ්‍යය S/T/E තීරුවේ) සටහන් කළ යුතු ය.

(vi) තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය පාඨමාලාව සඳහා වතු සේවකයන්ගේ දරුවන් අනෙකුත් විෂයන් සඳහා තෝරා ගන්නා පදනමින් තෝරා ගන්නා නමුත් ඔවුන් සඳහා ද පාඨමාලාව රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයෙහිම පැවැත්වේ.

**4.27 පාඨමාලා අංකය 27 - ව්‍යාපාර හා ගිණුම්කරණය (සිංහල)**
**ව්‍යාපාර හා ගිණුම්කරණය (දෙමළ)**

4.27.1 2012 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී (වාණිජ විෂයය ධාරාවට අයත්) ගිණුම්කරණය හා ව්‍යාපාර අධ්‍යයනය ඇතුළුව විෂයයන් තුනකින් (03) සමත් වීම;

*හා*

4.27.2 ව්‍යාපාර හා ගිණුම්කරණය/ව්‍යවසායකත්ව අධ්‍යයනය/ගණිතය යන විෂයයන් තුනෙන් අවම වශයෙන් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව සිංහල/දෙමළ භාෂාව ඉංග්‍රීසි භාෂාව ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

**4.30 පාඨමාලා අංකය 30 - දෙවන බස (සිංහල)**

4.30.1 දෙවන බස (සිංහල) පාඨමාලාවේ අයදුම්කරුවන් 2012 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී සිංහල භාෂාවට සම්මාන සාමාර්ථයක් ඇතුළුව විෂයයන් තුනකින් (03) සමත් වීම ;

*හා*

4.30.2 අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ගණිතය ඇතුළුව හර විෂයයන් හයකින් (06) සමත් වීම.

(*සැලකිය යුතුයි.-* මෙම පාඨමාලාවට බඳවා ගැනීමේ දී අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී දෙවන බස (දෙමළ) විෂයය හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දෙවන භාෂාව (දෙමළ) උසස් පාඨමාලාව හෝ වෛකල්පිත දෙමළ භාෂාව සමත් සිසුන්ට අනුපිළිවෙලින් ප්‍රමුඛතාවය හිමිවේ).

**4.31 පාඨමාලා අංකය 31 - දෙවන බස (දෙමළ)**

4.31.1 දෙවන බස (දෙමළ) පාඨමාලාවේ අයදුම්කරුවන් 2012 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් ඇතුළුව විෂයයන් තුනකින් (03) සමත් වීම ;

*හා*

4.31.2 අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව, ගණිතය ඇතුළුව හර විෂයයන් හයකින් (06) කින් සමත් වීම.

(*සැලකිය යුතුයි.-* මෙම පාඨමාලාවට බඳවා ගැනීමේ දී අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී දෙවන බස (සිංහල) විෂයය හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දෙවන භාෂාව (සිංහල) උසස් පාඨමාලාව හෝ වෛකල්පිත සිංහල භාෂාව සමත් සිසුන්ට අනුපිළිවෙලින් ප්‍රමුඛතාවය හිමිවේ.)

**4.32 පාඨමාලා අංකය 32 - විශේෂ අධ්‍යාපනය (සිංහල)**
**විශේෂ අධ්‍යාපනය (දෙමළ)**

4.32.1 2012 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑම විෂයයන් තුනකින් (03) සමත් වීම ;

*හා*

4.32.2 සිංහල/දෙමළ භාෂාව, ගණිතය ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

(*සැලකිය යුතුයි.-* මෙම පාඨමාලාවට තෝරාගනු ලබන අයදුම්කරුවන්ට පුහුණුවෙන් පසුව විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ශ්‍රවණ, දෘෂ්ටි, බුද්ධිමය ඌණතා, ඕටිසම්, ඉගෙනුම් දුෂ්කරතා, බහුවිධ දුබලතා ආදී ක්ෂෙත්‍ර සඳහා ගුරුවන්රුන් ලෙස පත්වීම් ලබාදීම සඳහා සලකා බලනු ඇත. එබැවින් ඉහත විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් සිටින ඒකකවල අනිවාර්යයෙන් සේවය කිරීමට එකඟ වන බවට ගිවිසුමකට එළඹීමට කැමති අයදුම්කරුවන් පමණක් මෙම පාඨමාලාවට අයදුම් කළ යුතුවේ.

5.0 පාඨමාලා අංකය, පාඨමාලාවේ නම, මාධ්‍යය අනුව එක් එක් පාඨමාලාව පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය එහි අංකය සහිතව පහතින් දැක්වේ :-

කරුණාකර මේ වගුව හොඳින් පරීක්ෂා කරන්න. සම්මුඛ පරීක්ෂණ සඳහා එක් එක් පාඨමාලාවට අදාළ පරිගණක ලේඛන සකස් කිරීමේ දී ඔබේ ඉල්ලුම් පත්‍රය පරිගණක ගත කරන්නේ පාඨමාලා අංකය අනුවය. නිවැරදි තොරතුරු සටහන් නොකළ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රය අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන විද්‍යාපීඨ ශාඛාවට ඉදිරිපත් කළ පසු කිසිදු සංශෝධනයක් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

i. තීරුව - පාඨමාලා අංකය ;
ii. තීරුව - පාඨමාලාවේ නම ;
iii. තීරුව - සිංහල මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ;
iv. තීරුව - දෙමළ මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ;
v. තීරුව - ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ;

(ඒ ඒ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ අංකය පීඨයේ නම ඉදිරියෙන් වරහන් තුළ දැක්වේ.)

| *පාඨමාලා අංකය* | *පාඨමාලාවේ නම* | *මාධ්‍යය අනුව එක් එක් පාඨමාලාව පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සහ ඒවායේ අංකය* | | |
|---|---|---|---|---|
| | | *සිංහල මාධ්‍යය* | *දෙමළ මාධ්‍යය* | *ඉංග්‍රීසි මාධ්‍යය* |
| *i* | *ii* | *iii* | *iv* | *v* |
| 01 | ප්‍රාථමික අධ්‍යාපනය | (2) නිල්වලා<br>(4) සාරිපුත්ත (දඹදෙණිය)<br>ශ්‍රී පාද<br>(11) පුලතිසිපුර<br>(12) වයඹ<br>(13) රුවන්පුර | (6) වවුනියා<br>(7) ශ්‍රීපාද<br><br><br>(8) අඩ්ඩාලච්චේන<br>(9) මඩකලපුව | |

| | | | | |
|---|---|---|---|---|
| | | (14) රුහුණ<br>(17) හාපිටිගම් | (15) යාපනය<br>(16) දර්ගා නගර | |
| 02 | විද්‍යාව | (2) නිල්වලා<br>(5) සියනෑ<br>(7) ශ්‍රීපාද | (6) වවුනියා<br>(7) ශ්‍රීපාද<br>(8) අඩ්ඩාලච්චේන<br>(9) මඩකලපුව<br>(15) යාපනය | (2) නිල්වලා<br>(5) සියනෑ<br>(15) යාපනය |
| 03 | ගණිතය | (2) නිල්වලා<br>(5) සියනෑ<br>(7) ශ්‍රීපාද | (7) ශ්‍රී පාද<br>(8) අඩ්ඩාලච්චේන<br>(15) යාපනය | (2) නිල්වලා<br>(5) සියනෑ<br>(15) යාපනය |
| 05 | බුද්ධ ධර්මය | (4) සාරිපුත්ත | | |
| 06 | හින්දු ධර්මය | | (6) වවුනියා | |
| 07 | ඉස්ලාම් ධර්මය | | (8) අඩ්ඩාලච්චේන | |
| 08 | කතෝලික ධර්මය/ක්‍රිස්තියානි ධර්මය | (12) වයඹ | (6) වවුනියා | |
| 09 | පළමුබස (සිංහල) | (12) පේරාදෙණිය | | |
| 10 | පළමුබස (දෙමළ) | | (7) ශ්‍රීපාද<br>(16) දර්ගා නගරය<br>(18) පේරාදෙණිය | |
| 11 | ඉංග්‍රීසි | | | (3) මහවැලි<br>(10) පස්දුන්රට<br>(15) යාපනය<br>(18) පේරාදෙණිය |
| 13 | චිත්‍ර | (12) වයඹ | (9) මඩකලපුව | |
| 17 | සංගීතය (කර්ණාට) | | (7) ශ්‍රීපාද<br>(9) මඩකලපුව | |
| 18 | බටහිර සංගීතය | | | (3) මහවැලි |
| 20 | ශාරීරික අධ්‍යාපනය | (1) ඌව | (6) වවුනියා | (1) ඌව |
| 21. | ගෘහ ආර්ථික විද්‍යාව | (14) රුහුණ | (16) දර්ගා නගර | |
| 22 | කෘෂි හා ආහාර තාක්‍ෂණය | (11) පුලතිසිපුර | (6) වවුනියා | |
| 23 | තාක්ෂණ අධ්‍යයනය - ශිල්ප කලා | (5) සියනෑ | (9) මඩකලපුව | |
| 24 | නිර්මාණකරණය හා තාක්‍ෂණවේදය | (5) සියනෑ | (9) මඩකලපුව | |
| 25 | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | | | (13) රුවන්පුර |
| 27. | ව්‍යාපාර හා ගිණුම්කරණය | (19) මහරගම | (6) වවුනියා<br>(8) අඩ්ඩාලච්චේන | |
| 30. | දෙවන බස (සිංහල) | (3) මහවැලි | | |
| 31. | දෙවන බස (දෙමළ) | | (3) මහවැලි | |
| 32 | විශේෂ අධ්‍යාපනය | (17) හාපිටිගම් | (8) අඩ්ඩාලච්චේන<br>(15) යාපනය | |

*සැලකිය යුතුයි :*

(i) දෙමළ මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන දර්ගා නගර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අයදුම්කළ යුත්තේ කාන්තාවන් පමණි.
(ii) සංගීතය (කර්ණාට) පාඨමාලාව දෙමළ මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.
(iii) බටහිර සංගීතය සහ තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

6.0 *2014 වර්ෂය සඳහා ශික්‍ෂණලාභීන් තෝරා ගැනීමේ පටිපාටිය :*

6.1 *තෝරා ගැනීමේ පදනම :*

6.1.1 2017 වසරේ පාසල් පද්ධතියේ ගුරු අවශ්‍යතාව පදනම් කරගෙන බඳවා ගන්නා ශික්ෂණලාභීන් සංඛ්‍යාව තීරණය කර ඇත.

6.1.2 කතෝලික/ක්‍රිස්තියානි ධර්මය සිංහල මාධ්‍යය පාඨමාලාව සහ ශාරීරික අධ්‍යාපනය පාඨමාලාව හැර අනෙකුත් පාඨමාලා සඳහා බඳවා ගැනීමේ මූලික පදනම ඒ ඒ දිස්ත්‍රික්කවල අයදුම්කරුවන්ගේ Z ලකුණු කුසලතා අනුපිළිවෙල වේ. කතෝලික/ක්‍රිස්තියානි ධර්මය සිංහල මාධ්‍යය පාඨමාලාවට තෝරා ගැනීමේ දී එක් එක් දිස්ත්‍රික්කවල වෙසෙන කතෝලික ජනගහනය පදනම් කර ගනිමින්, ඒ ඒ දිස්ත්‍රික්කවල අයදුම්කරුවන්ගේ Z ලකුණු කුසලතා අනුපිළිවෙලට තෝරා ගනු ලැබේ. ශාරීරික අධ්‍යාපනය පාඨමාලාවට තෝරා ගැනීමේ දී එක් එක් දිස්ත්‍රික්කවල අයදුම්කරුවන්ගේ ක්‍රීඩා කුසලතා අනුපිළිවෙල අනුව තෝරාගනු ලැබේ. ඉංග්‍රීසි පාඨමාලාවට තෝරා ගැනීමේ දී 4.11 ඡේදයේ 4.11.1 හි සඳහන් සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොසිටියහොත් පමණක් ඒ ඒ දිස්ත්‍රික්කවල අයදුම්කරුවන්ගේ ප්‍රවීණතා පරීක්‍ෂණයේ ලකුණු කුසලතා අනුපිළවෙලට තෝරා ගනු ලබන අතර, තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය පාඨමලාවට තෝරා ගැනීමේ දී 4.25 ඡේදයේ 4.25.1 හි සඳහන් සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොසිටියහොත් පමණක් ඒ ඒ දිස්ත්‍රික්කවල අයදුම්කරුවන්ගේ ප්‍රවීණතා පරීක්‍ෂණයේ ලකුණු කුසලතා අනුපිළිවෙලට තෝරා ගනු ලැබේ. Z ලකුණු කුසලතාව අනුව තෝරා ගන්නා පාඨමාලාවල දී අදාළ දිස්ත්‍රික්කයේ එකම Z අගයක් ලබා ගෙන ඇති සිසුන් කිහිප දෙනෙකු අතරින් එක් අයෙකු තෝරා ගැනීමට සිදුවන විටක දී/ප්‍රවීණතා/ක්‍රීඩා කුසලතා එකම ලකුණක සිසුන් කිහිප දෙනෙකු අතරින් එක් අයෙකු තෝරා ගැනීමට සිදුවන විටක දී, පළමුවරට අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ලබා ගත් ප්‍රතිඵල සැළකිල්ලට භාජනය කෙරේ. විශිෂ්ඨ සාමාර්ථයකට ලකුණු 04ක් ද, අධි සම්මාන සාමාර්ථයකට ලකුණු 03ක් ද, සම්මාන සාමාර්ථයකට ලකුණු 02ක් ද, සාමාන්‍ය සාමාර්ථයකට ලකුණු 01ක් ද, බැගින් ලකුණු ප්‍රදානය කොට සමස්ත ලකුණු සංඛ්‍යාව පදනම් කර ගනිමින් නියමිත පුරප්පාඩු සංඛ්‍යාව පුරවනු ලැබේ. මෙම ලකුණු දීම ප්‍රධාන විෂයයන් 08කට පමණක් සීමා කෙරේ. ප්‍රවීණතා/ක්‍රීඩා කුසලතා හා අ. පො. ස. (සා. පෙළ) ට ලබා දෙන ලකුණ ද සමාන වන අවස්ථාවක ඒ ඒ දිස්ත්‍රික්කයේ Z අගය ප්‍රමුඛතා අනුපිළිවෙලට තෝරා ගනු ලැබේ.

6.1.2.1 2014 වර්ෂය සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට සිසුන් තෝරා ගැනීමේ දී නව නිර්දේශය සහ පැරණි නිර්දේශය යන විෂය නිර්දේශ දෙක වෙන් වෙන්ව සලකා බලනු ලැබේ.

6.1.3 ශාරීරික අධ්‍යාපනය, විද්‍යාව, ගණිතය, බටහිර සංගීතය හා තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය යන පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් හා ප්‍රාථමික අධ්‍යාපනය පාඨමාලාව සිංහල/දෙමළ මාධ්‍යයෙන් හැදෑරීමට ඉල්ලුම්කරන එක් එක් දිස්ත්‍රික්කවල අයදුම්කරුවන් අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ද, ඉංග්‍රීසි පාඨමාලාව හැදෑරීමට ඉල්ලුම්කරන එක් එක් දිස්ත්‍රික්කවල අයදුම්කරුවන් අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සම්මාන සාමාර්ථයක් ද, ව්‍යාපාර හා ගිණුම්කරණය පාඨමාලාව සිංහල/දෙමළ මාධ්‍යයෙන් හැදෑරීමට ඉල්ලුම්කරන එක් එක් දිස්ත්‍රික්වල අයදුම්කරුවන් අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ද, සහිතව සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව හර විෂයයන් හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත්වීම අවශ්‍ය වේ.

6.1.4 ශාරීරික අධ්‍යාපනය, සංගීතය (කර්ණාට), සහ බටහිර සංගීතය පාඨමාලාව සඳහා පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයේ දී (දිස්ත්‍රික් පදනමින් යෝග්‍යතාවය පිළිබඳව සතුටුදායක කුසලතා මට්ටමකට ළඟා විය යුතු ය.

6.2 *දිස්ත්‍රික්ක පදනම :*

6.2.1 *දිස්ත්‍රික්ක නිර්ණය කිරීම :*

6.2.1.1 යම් පාසල් අපේක්ෂකයෙකුගේ දිස්ත්‍රික්කය වන්නේ පළමුවරට අ.පො.ස. (උ. පෙළ) විභාගයට පෙනී සිටි මාසයට පෙරාතුව වූ මාසය දක්වා වූ වසර 5 තුළ සම්පූර්ණ කාලය හෝ වැඩිම කාලයක් (අවුරුදු 2 1/2ට වැඩි) ඔහු/ඇය ඉගෙනීම කළ පාසල/පාසල් පිහිටා ඇති දිස්ත්‍රික්කයයි.

6.2.1.2 යම් පෞද්ගලික අපේක්ෂකයෙකු ඊට ප්‍රථමයෙන් පාසල් අපේක්ෂකයෙකු වශයෙන් පළමුවරට අ.පො.ස. (උ. පෙළ) විභාගයට පෙනී සිට පාසල හැර ගොස් ඇති අවස්ථාවක එකී අපේක්ෂකයාගේ දිස්ත්‍රික්කය වන්නේ ප්‍රථමයෙන් එකී විභාගයට පෙනී සිටි පාසල පිහිටි දිස්ත්‍රික්කයයි.

6.2.1.3. යම් අපේක්ෂකයෙකු යම් හෙයකින් පාසල් අපේක්ෂකයෙකු වශයෙන් අ.පො.ස. (උ. පෙළ) විභාගයට කලින් පෙනී නොසිට පාසල් හැර ගොස් ඇති අවස්ථාවක එකී අපේක්ෂකයාගේ දිස්ත්‍රික්කය වන්නේ අ.පො.ස. (උ. පෙළ) විභාගයට පළමුවරට පෙනීසිටි මාසයට පෙරාතුවම වූ මාසයේ අවසාන දිනය දක්වා ඇති වර්ෂ 05 තුළ වැඩිම කාලයක් (අවුරුදු 2 1/2 කට වැඩි) අධ්‍යාපනය ලැබූ පාසල හෝ පාසල් පිහිටා ඇති දිස්ත්‍රික්කයයි.

6.2.1.4 පාසලක අධ්‍යාපනය නොලැබූ පෞද්ගලික අපේක්ෂකයෙකු නම් ග්‍රාමසේවා නිලධාරී හා ප්‍රාදේශීය ලේකම්ගේ දිවුරුම් ප්‍රකාශයක් හෝ මැතිවරණ දෙපාර්තමේන්තුවේ ඡන්ද හිමි නාම ලේඛනය මගින් පමණක් ඉහත දිස්ත්‍රික්කයට පදිංචිය තහවුරු කළ යුතු ය.

6.2.1.5 එක් එක් දිස්ත්‍රික්කය සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටි අවස්ථාවක දී යාබද දිස්ත්‍රික්කවලින් පුරප්පාඩු පුරවනු ලැබේ.

6.3 *ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට තෝරා ගැනීම* :

6.3.1 පුරප්පාඩු සංඛ්‍යාවෙන් 75% ක් ඉන්දියානු ද්‍රවිඩ සම්භවය ඇති අයදුම්කරුවන්ගෙන් ද, 25% ක් සිංහල අයදුම්කරුවන්ගෙන් ද පුරවනු ලැබේ.

6.3.1.1 වතු පාසල් පිහිටි දිස්ත්‍රික්කවල පවත්නා පුරප්පාඩුවල ප්‍රමාණාත්මකභාවය අනුව අයදුම්කරුවන්ගෙන් 35%ක් මොණරාගල, බදුල්ල සහ රත්නපුර යන දිස්ත්‍රික්කවලට වෙන් කෙරේ.

6.3.2 ප්‍රාථමික අධ්‍යාපනය, ගණිතය, විද්‍යාව යන පාඨමාලා සිංහල මාධ්‍යයෙන් ද, ප්‍රාථමික අධ්‍යාපනය, ගණිතය, විද්‍යාව, කර්ණාට සංගීතය, පළමු බස (දෙමළ), යන පාඨමාලා දෙමළ මාධ්‍යයෙන් ද පැවැත්වේ. (ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ පැවැත්වෙන්නේ ඉහත පාඨමාලා පමණි.).

6.3.3

6.3.3.1 ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඉල්ලුම් කළ යුත්තේ නුවරඑළිය, මහනුවර, මාතලේ, බදුල්ල, මොණරාගල, රත්නපුරය, කෑගල්ල, කළුතර, මාතර, ගාල්ල සහ කුරුණෑගල යන වැවිලි දිස්ත්‍රික්කවල පදිංචි වැවිලි අංශයේ සේවයේ නියුතු අයගේ දරුවන් පමණි. දැනටමත් වැවිලි අංශයේ සේවයේ නියුතු අයගේ දරුවන්ට හා දැනටමත් වතුවල පදිංචි, වැවිලි අංශයේ වසර 25ක් සේවය කිරීමෙන් පසුව 2003 - 2002 වසර අතරතුර කාලයෙහි විශ්‍රාම ගිය, අසනීප හේතුවෙන් සේවයෙන් ඉවත් වූ හෝ මරණයට පත් වූ අයගේ දරුවන්ට ප්‍රමුඛතාව හිමි වේ.

6.3.3.2 6.3.3.1 හි සඳහන් අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති වුවහොත්, දැනට වතු අංශයේ සේවය නොකළ ද, 2003 හෝ ඊට පසු වර්ෂවල වතු අංශයේ අවම වශයෙන් වසර 05 ක් අඛණ්ඩව සේවය කළ අයගේ දරුවන් පිළිබඳව සලකා බලනු ලැබේ. (ප්‍රමුඛතාව හිමිවන්නේ 2012, 2011, 2010 ආදී වශයෙන් අනුපිළිවෙලිනි.)

6.3.3.3 යම් දෙමළ මාධ්‍ය පාඨමාලාවකට ඉහත අයදුම්කරුවන් අතුරින් සුදුසුකම් ලබන ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් ඉහත දිස්ත්‍රික්කවල පදිංචි වැවිලි අංශයේ සේවය නොකරන එහෙත් ඉන්දියානු සම්භවයක් සහිත අයදුම්කරුවන් පිළිබඳව සලකා බලනු ලැබේ.

6.3.3.4. ඒ අනුව ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් වෙනත් දිස්ත්‍රික්කවල පදිංචි ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ මාධ්‍ය අයදුම්කරුවන් පිළිබඳව සලකා බලනු ලැබේ.

6.3.3.5 වැවිලි අංශයේ සේවය නොකරන එහෙත් වැවිලි දිස්ත්‍රික්කවල පදිංචි ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ මාධ්‍ය අයදුම්කරුවන් සහ වෙනත් දිස්ත්‍රික්කවල පදිංචි ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ මාධ්‍ය අයදුම්කරුවන් සඳහා අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී නියමිත විෂයයන් තුනක් (3) සමත්වීම අනිවාර්ය වේ.

6.3.3.6 සිංහල මාධ්‍ය පාඨමාලාවලට වැවිලි දිස්ත්‍රික්කවල පදිංචි වැවිලි අංශයේ පදිංචිකරුවන්ගේ දරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති වුවහොත් ඉතිරි පුරප්පාඩු පුරවනු ලබන්නේ වෙනත් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල එම පාඨමාලාවලට අයදුම්කර ඇති අයදුම්කරුවන් අතුරින් "Z" අගය පදනම් කර ගනිමිනි.

6.3.4 රාජ්‍ය හා ලියාපදිංචි පෞද්ගලික වතු සමාගම්වල සේවකයන්ගේ දරුවන් ඒ බව තහවුරු කිරීම සඳහා වතු අධිකාරිගේ ලිපිය (සේවකයා සේවය කළ දින වකවානු සහිතව) පසුගිය වසර 05ක් හෝ ඊට වැඩි කාලයක් වැවිලි අංශයේ සේවයේ නියුතු හා වතුවල ස්ථිරව පදිංචිව සිටින බවට/වතු සේවයේ යෙදී සිට විශ්‍රාම ගිය වර්ෂය සහ දිනය පැහැදිලිව සඳහන් වන, වතු අධිකාරී විසින් සහතික කරන ලද ලිපිය අවශ්‍ය වේ. පුහුණුවෙන් පසුව වතු අංශයේ පාසල්වල අඛණ්ඩව වසර 10ක් සේවය කරන බවට පොරොන්දු වන ලිපියක් හා සේවක අර්ථසාධක අරමුදලට අය කිරීම් කරන බව ලියාපදිංචි අංක සහිතව ඔප්පු කරන ලිපි සම්මුඛ පරීක්ෂණයේ දී අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතු වේ.

6.3.5 අදාළ සෑම දිස්ත්‍රික්කයකින් ම අවම වශයෙන් එක් අයදුම්කරුවෙකුවත් තෝරා ගැනීම සඳහා සලකා බලනු ලැබේ.

*සැළකිය යුතුයි.*—සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ ඉන්දියානු සම්භවයක් ඇති අයදුම්කරුවෙකු නම් ඉන්දියානු සම්භවයට හිමි ප්‍රතිශතය සඳහා සලකා බලනු ලැබේ. එමෙන් ම දෙමළ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහල අයදුම්කරුවෙකු නම් සිංහල මාධ්‍යය ප්‍රතිශතය සඳහා සළකා බලනු ලැබේ.

7.0 *තෝරා ගැනීමට අදාළ වෙනත් කරුණු :*

7.1 තෝරාගනු ලබන අයදුම්කරුවන් අදාළ පාඨාමාලාව සඳහා යෝග්‍යතාවය සනාථ කිරීමට පිළිගත හැකි සාක්ෂි සහ සහතිකවල මූලික පිටපත් සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනට ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතු ය. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. නියමිත දින කිසිදු දැනුම් දීමකින් තොරව සම්මුඛ පරීක්‍ෂණයට සහභාගි නොවූ අයදුම්කරුවන් වෙනුවට වෙනත් අයදුම්කරුවන් කැඳවනු ලබන අතර, නොපැමිණි අයදුම්කරුවන් පිළිබඳව නැවත සලකා බලනු නොලැබේ.

7.2 සියලුම සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණ දිනට ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර, එදිනට ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම්කරුවන් තෝරා ගනු නොලැබේ.

7.3 පාඨමාලාවේ අපේක්ෂිත මට්ටමකට ළඟා වීමට අයදුම්කරුවන් වෙත තිබිය යුතු කායික මානසික යෝග්‍යතාව පිළිබඳ ගැටළු තත්ත්වයන් නිරීක්ෂණය වූ අවස්ථාවක එකී තත්ත්වයන් පිළිබඳ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සෑහීමකට පත් නොවේ නම්, විශේෂ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක පරීක්ෂණයකට භාජනය කොට එහි වාර්තාව අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලයට/අධ්‍යාපන ලේකම්ට ඉදිරිපත් කර ලබා ගන්නා තීරණ ක්‍රියාත්මක කරනු ඇත.

7.4 තෝරා ගනු ලබන අයදුම්කරුවන් අදාළ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ලියාපදිංචි වීමට නියමිත දිනයේ සිට දින 03 ක් ඇතුළත ලියාපදිංචි නොවුවහොත් ඇතුළත්වීමේ අවස්ථාව ඔහුට/ඇයට අහිමි වනු ඇත. මේ අනුව ඇතිවන පුරප්පාඩු ඒ ඒ දිස්ත්‍රික්කවල කුසලතා අනුපිළිවෙලට පුරවනු ලැබේ.

7.4.1 එබැවින් නියමිත දිනට ලියාපදිංචි නොවන අයදුම්කරුවන් විසින් පසුව කරනු ලබන ඉල්ලීම් පිළිබඳව කිසිසේත් ම සළකා බැලීමට අවස්ථාව නොමැති බව අවධාරණය කෙරේ.

7.5 තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු මානසික හා කායික සෞඛ්‍යයෙන් යුක්ත දැයි පරීක්ෂාකර බැලීම සඳහා විද්‍යාපීඨවලට ඇතුළත් වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.

7.6 යම් පාඨමාලාවකට/ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකට තෝරා ගත් පසු ඒ පාඨමාලාව/ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. කිසියම් පාඨමාලාවකට ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක ළඟම ඇති විද්‍යාපීඨයකට අදාළ පාඨමාලාව හැදෑරීමට මාරු කරනු ලැබේ.

8.0 *පාඨමාලා සඳහා අයැදුම් කිරීමට හෝ ඇතුළත්වීමට නුසුදුස්සන් :*

8.1 දැනටමත් රජයේ හෝ පෞද්ගලික පාසැල්වල ගුරු පත්වීම් ලබා ඇති අය,
8.2 රජයේ පාසලක පත්වීමක් සඳහා තෝරා ගනු ලැබ සිටින අය,
8.3 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක පාඨමාලාවක් හදාරන හෝ හැදෑරූ අය,
8.4 විශ්ව විද්‍යාලයක/විශ්ව විද්‍යාල විද්‍යායතනයක/වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක/අ.පො.ස. (උ. පෙළ) සුදුසුකම්වලින් බඳවා ගන්නා පාඨමාලාවක ලියාපදිංචි/හදාරමින් සිටින හෝ උපාධි පාඨමාලාවක් හදාරා අවසන් කළ අය. (දැනට ඉහත ආයතනයක ලියාපදිංචි වී සිටින සිසුන් *ගැසට් නිවේදනය* පළවීමෙන් පසුව ලියාපදිංචිය අවලංගු කර ගත්ත ද ඔවුහු අයදුම් කිරීමට/ඇතුළත්වීමට සුදුසුකම් නොලබති.)
8.5 විනයානුකූල හේතූන් මත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකින් ඉවත් කරනු ලැබූ අය.

9.0 *පුහුණුව සඳහා අදාළ කොන්දේසි ෟ*

9.1 පුහුණු පාඨමාලාවක කාල සීමාව අවුරුදු තුනකි. එය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ අවුරුදු දෙකක නේවාසික ආයතනික පුහුණුවකින් ද, පාසලකට අනුයුක්තව සිදු කෙරෙන වසරක සීමාවාසී පුහුණුවකින් ද සමන්විත වේ. දෙවන වසර අවසානයේ දී විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන බාහිර අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා ශික්‍ෂණලාභියාගේ පැමිණීම 90% කට නොඅඩු විය යුතු ය.

9.2 සෑම ශික්‍ෂණලාභියෙකු ම පළමු වසරේ සහ දෙවන වසරේ පවත්වනු ලබන අභ්‍යන්තර අඛණ්ඩ පරීක්ෂණවලින් ද, දෙවන වසර අවසානයේ පවත්වනු ලබන අභ්‍යන්තර පරීක්ෂණවලින් ද, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන අවසාන බාහිර විභාගයෙන් ද සමත් විය යුතු යි. එමෙන් ම ඉංග්‍රීසි මාධ්‍යය පාඨමාලාව හදාරණ අය හැර අනෙක් සියලුම පාඨමාලා හදාරන අය ඉහත විභාගවල දී ඉංග්‍රීසි විෂයයෙන් සමත් විය යුතු ය. ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ එම කොන්දේසිවලට එකඟ වන අය පමණි.

9.3 ශික්‍ෂණලාභියෙකුට නේවාසික පුහුණුව ලබන වර්ෂ දෙක තුළ දී වර්ෂයකට මාස 10 ක් සඳහා මාසයකට රු. 2,500 ක වටිනාකමින් යුත් ආහාරපාන හා නේවාසික පහසුකම් සපයනු ලැබේ. සීමාවාසි වර්ෂය තුළ දී මාස 10 ක් සඳහා මාසයකට රු. 3,000 බැගින් යුත් දීමනාවක් ගෙවනු ලැබේ. පෞද්ගලික අවශ්‍යතාවලට අදාළ සෙසු වියදම් ශික්‍ෂණලාභියා විසින් දැරිය යුතු ය.

9.4 පුහුණුවන කාල සීමාව තුළ දී ශික්‍ෂණලාභියා විශ්ව විද්‍යාලයක, විශ්ව විද්‍යාල විද්‍යායතනයක, වෙනත් ආයතනයක උසස් පෙළ සුදුසුකම්වලින් බඳවා ගන්නා පාඨමාලාවක, අභ්‍යන්තර ශිෂ්‍යයෙකු වශයෙන් අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමට කිසිසේත් අවසර දෙනු නොලැබේ. එසේ පාඨමාලාවක නිරත වන බව සනාථ වුවහොත් හෝ පුහුණුව සඳහා නියමිත වසර තුනක (03) කාලසීමාව සම්පූර්ණ කිරීමට පෙර පුහුණුව අත්හරින්නේ නම් හෝ ශික්‍ෂණලාභියා වෙනුවෙන් දරන ලද වියදම ආපසු අය කරගෙන පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

9.5 පුහුණුවන කාල සීමාව තුළ දී ශික්‍ෂණලාභියා විවාහවුවහොත් ශිෂ්‍ය භාවය අවලංගු කරනු ලැබේ. විවාහ වී ඇති බව හෙළි වීමෙන් පසුව විවිධ හේතු දක්වමින් දික්කසාද වන අයට නැවත ශිෂ්‍යභාවය ලබා දීමක් සිදු නොකෙරේ. භික්‍ෂූන් වහන්සේලා/පූජකවරුන් ලියාපදිංචි වීමෙන් පසු උපැවිදි වුවහොත් පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ. පුහුණුව අවසන් කළ පසු සෑම ආගමකටම අයත් පූජ්‍ය/පූජක පක්ෂය උපැවිදි නොවී අවම වශයෙන් අවුරුදු 05 ක් අධ්‍යාපන අමාත්‍යාංශයට සේවය කරන බවට අමාත්‍යාංශය සමග ඇප බැඳුම්කරය සහ ගිවිසුමකට එළඹිය යුතුයි.

9.6 පුහුණුවන කාල සීමාව තුළ අපේක්ෂිත හැසිරීම, උද්යෝගය හා අධ්‍යයන කටයුතුවල ප්‍රගතිය නොපෙන්වන ශික්‍ෂණලාභියෙකු පුහුණුවෙන් ඉවත් කරනු ලැබේ. එසේම ශාස්ත්‍රීය පුහුණුවේ ප්‍රථම වර්ෂය තුළ දී කරනු ලබන ඇගයීමේ දී සතුටුදායක මට්ටමකට එළඹීමට අසමත් හෝ 9.4 ඡේදයේ දැක්වෙන පාඨමාලාවක් හදාරන බව සනාථ වුවහොත් පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ. මේ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන විද්‍යායතනික මණ්ඩලයේ/අධ්‍යාපන ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

9.7 පුහුණුවන කාල සීමාව තුළ දී ශික්‍ෂණලාභියාගේ කායික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් පීඨාධිපතිගෙන් හෝ සීමාවාසී කාල සීමාව තුළ විදුහල්පතිගෙන් පැමිණිලි ලැබේ නම් නැවත විශේෂ සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් කරනු ලැබේ. එහි වාර්තාව අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලයට/අධ්‍යාපන ලේකම්ට ඉදිරිපත් කර අවසාන තීරණය ගනු ලැබේ.

9.8 පුහුණු පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කරන ශික්‍ෂණලාභීන්ට ජාතික ශික්‍ෂණ විද්‍යා ඩිප්ලෝමාව ප්‍රදානය කරනු ලැබේ. පාඨමාලාශ්‍රිත වැඩ හා පෞරුෂ වර්ධනය (අනිවාර්යයෙන් ම සහභාගී විය යුතු විෂයය සමගාමී කටයුතු ඇතුළු) පුහුණුවීම් කාලය තුළ දී අඛණ්ඩ ලෙස අගයනු ලබන අතර, මේ ඇගයීම් ජාතික ශික්‍ෂණ විද්‍යා ඩිප්ලෝමාව ප්‍රදානය කිරීම සඳහා කරනු ලබන අවසාන ඇගයීමේ කොටසක් වනු ඇත.

9.9 මෙම පාඨමාලාවන් සාර්ථක ලෙස සම්පූර්ණ කරන අයදුම්කරුවන් පුරප්පාඩු පවත්නා දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ඇති වන ඇබෑර්තු පදනම් කර ගෙන ගුරු පත්වීම් ලබා දීම සඳහා සලකා බලනු ලැබේ.

9.9.1 ශාරීරික අධ්‍යාපනය, ගණිතය, විද්‍යාව, වැනි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ශික්‍ෂණලාභීන් ඔවුන් පත්වීම් ලබන පාසලෙහි ඉංග්‍රීසි මාධ්‍ය ඇබෑර්තු නොමැති වුවහොත් තම මවු බසින් (සිංහල/දෙමළ මාධ්‍යයෙන්) ඉගැන්වීම කළ යුතු වේ.

9.9.2 අනාගතයේ දී රජයේ පාසල්වලට ගුරු පත්වීම් දීමේ දී මෙම පුහුණු පාඨමාලා සම්පූර්ණ කළ අයට ප්‍රමුඛත්වය ලැබෙනු ඇත. එබැවින් පාඨමාලා සඳහා තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණවලට කැඳවීම් ලබන අයදුම්කරුවන් ඉහත කොන්දේසිවලට එකඟවන්නේ නම් පමණක් සම්මුඛ පරීක්ෂණවලට ඉදිරිපත් විය යුතු වේ.

9.9.3 ඉහත කොන්දේසි යටතේ පුහුණුව ලබන අයදුම්කරුවන් අනිවාර්යයෙන් ම තමා පුහුණුව ලබන විෂයය ඉගැන්වීමෙහි නිරත විය යුතු ය. තව ද ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව මුල් පත්වීම ලබන දිස්ත්‍රික්කයේ අවම වශයෙන් පත්වීම් දින සිට පස් අවුරුද්දක් (05) අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන බවට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සමඟ ඇප බැඳුම්කරය සහ ගිවිසුමකට බැඳිය යුතු ය. මෙම වසර පහ (05) තුළ පත්වීම් ලබාදෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කිසිසේත් වෙනස් කරනු නොලැබේ.

9.10 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක ලියාපදිංචි වන අයදුම්කරුවන් පුහුණුවට වැයවන මුදල සහ වෙනත් යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් රු. 5,00,000 ක ඇප බැඳුම්කරය සහ ගිවිසුමකට අත්සන් කළ යුතු ය. පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව වසර 05 ක් රජය යටතේ සේවය නොකරන අයෙකු මෙම ඇප බැඳුම්කරය සහ ගිවිසුමෙහි සම්පූර්ණ මුදල රජයට ගෙවීමේ කොන්දේසියකට යටත් වේ.

9.11 අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පුහුණුව සඳහා බඳවා ගනු ලබන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, වෛද්‍ය/පෞද්ගලික හේතු මත වෙනස් කර ගැනීමට යම් ශික්‍ෂණලාභියකු උත්සාහ දරන්නේ නම් ඔහු හෝ ඇය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකට ඇතුළත් කර ගැනීමට සුදුසුකම් නොලබයි.

9.12 සියලුම අධ්‍යාපන හා සෙසු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනයට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතු ය.

10.0 *අයදුම්කිරීම* :

10.1 එක් අයදුම්කරුවෙකුට උපරිම වශයෙන් පාඨමාලා තුනකට (03) අයදුම් කළ හැකි ය. එකම පාඨමාලාවකට මාධ්‍යය දෙකකින් අයදුම් කළහොත් එය ද පාඨමාලා දෙකකට (02) අයදුම් කළා සේ සැළකේ. එවැනි අයදුම්කරුවෙකුට තවත් එක් පාඨමාලාවකට පමණක්

අයදුම් කළ හැකිය. බෞද්ධ භික්ෂූන් වහන්සේලා බුද්ධ ධර්මය පාඨමාලාවට ද, කතෝලික, හින්දු, ඉස්ලාම් පූජක තුමන්ලා අදාළ ආගමික පාඨමාලාවලට ද පමණක් අයදුම් කළ යුතු ය.

*උදා.* : විද්‍යාව පාඨමාලාව සිංහල මාධ්‍යය සහ විද්‍යාව පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යය යන දෙකටම අයදුම්කළ අයදුම්කරුවෙකුට අයදුම් කළ හැක්කේ තවත් එක් පාඨමාලාවකට පමණි.

10.2 එක් අයදුම්කරුවෙකු විසින් එක් අයදුම්පත්‍රයක් පමණක් ඉදිරිපත් කළ යුතු ය. එම ඉල්ලුම්පත හැර වෙනත් ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇත්නම් සියලුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ශාරීරික අධ්‍යාපනය, බුද්ධ ධර්මය, හින්දු ධර්මය, ඉස්ලාම් ධර්මය, කතෝලික ධර්මය /ක්‍රිස්තියානි ධර්මය, තාක්‍ෂණ අධ්‍යයනය, - ශිල්ප කලා, නිර්මාණකරණය හා තාක්‍ෂණවේදය, බටහිර සංගීතය යන පාඨමාලා අයදුම් කරන අයදුම්කරුවන් පමණක් තම අයදුම්පත සමඟ එහි සහතික කළ පිටපත් දෙකක් (02) පමණක් එකම කවරයක බහා ඉදිරිපත් කළ යුතු ය.

10.3 අයදුම්පත්‍රය පහත දැක්වෙන උපදෙස් හා ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කළ යුතු ය.

10.4 අයදුම්පත්‍ර 2014.02.21 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ප්‍රධාන කොමසාරිස්, (ගුරු අධ්‍යාපන), විද්‍යාපීඨ ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අයදුම්පත්‍රය බහා එවන කවරයේ ආදර්ශය පහත දැක්වේ. :-

<table>
<tr><td colspan="2">2014 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත්වීම සඳහා අයදුම්පත්‍රය,<br>පළමු මනාපය ලෙස දක්වා ඇති පාඨමාලා අංකය ……… මාධ්‍යය ………<br>ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඉල්ලුම් කරන්නේ ද ඔව්/නැත.<br>නව/පැරණි නිර්දේශය</td></tr>
<tr><td></td><td>ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන)<br>විද්‍යාපීඨ ශාඛාව,<br>අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය,<br>බත්තරමුල්ල.</td></tr>
</table>

(විභාග දෙපාර්තමේන්තුවට හෝ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට අයදුම්පත්‍ර නොඑවිය යුතු බව අවධාරණය කරමි.)

10.5 සෑම අයදුම්කරුවකුම සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි ඡායා පිටපතක් අනිවාර්යයෙන්ම තමා ළඟ තබා ගත යුතු වේ. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට බඳවා ගැනීම සම්බන්ධයෙන් විමසීමක් හෝ අභියාචනයක් ඉදිරිපත් කරන සෑම අවස්ථාවකදීම ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි තැපැල් කුවිතාන්සිය සහ ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.

10.6 විභාග අංකය, වර්ෂය, පාඨමාලා අංකය නිවැරදිව ඇතුළත් නොකරන ලද හා අසම්පූර්ණ, අවිධිමත් අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10.7 අයදුම්පත්‍ර ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

10.8 අයදුම්පත්‍රයට වෙනත් කිසිදු ලියවිල්ලක් අමුණා නොඑවිය යුතු ය.

10.9 අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන සහතික කූට හෝ වංචනික හෝ සහතිකයක් බවට පසුව හෙළි වුවහොත් අයදුම්කරු සේවයෙන් පහ කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ කිසිම පත්වීමක් සඳහා නුසුදුස්සෙකු වනු ඇත.

11.0 *ගැසට්* නිවේදනයේ ඉහත සඳහන් තොරතුරු මත මතුවන ගැටලු පිළිබඳව අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

12.0 මෙම *ගැසට්* නිවේදනයෙහි සිංහල හා දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වේ.

අනුර දිසානායක,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2014 ජනවාරි මස 17 වැනි දින,
ඉසුරුපාය, බත්තරමුල්ල,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

**අයදුම්පත පිළියෙල කිරීම සඳහා උපදෙස්**

1.0 ගැසට් නිවේදනය කීපවරක් සැළකිල්ලෙන් කියවන්න. ඔබට සුදුසුකම් ඇති පාඨමාලා තුනකට එක් අයදුම්පත්‍රයක පමණක් අයදුම් කරන්න. ශාරීරික අධ්‍යාපනය, බුද්ධ ධර්මය, හින්දු ධර්මය, ඉස්ලාම් ධර්මය, කතෝලික ධර්මය/ක්‍රිස්තියානි ධර්මය, තාක්‍ෂණ අධ්‍යයනය - ශිල්ප කලා, නිර්මාණකරණය හා තාක්‍ෂණවේදය, බටහිර සංගීතය යන පාඨමාලා අයදුම්කරන අයදුම්කරුවන් පමණක් තම අයදුම්පත්‍රය සමග එහි සහතික කළ ඡායා පිටපත් දෙකක් (02) පමණක් එකම කවරයක බහා ඉදිරිපත් කළ යුතු ය. (පාසල් අයදුම්කරුවන් විදුහල්පති මගින් ද, පෞද්ගලික අයදුම්කරුවන් සාමදාන විනිශ්චයකරුවකු මගින් ද ඡායා පිටපත් දෙක සහතික කරවා ගත යුතු ය.)

2.0 පහත දැක්වෙන ආදර්ශය අනුව (Legal) F5 ප්‍රමාණයේ (සෙන්ටි මීටර් 21.8 x සෙන්ටිමීටර් 33) සුදු කඩදාසියක අයදුම්පත පිළියෙල කරන්න. 1.0 - 9.5 දක්වා ඡේද පළමුවැනි පිටුවට ඇතුලත් වන සේ සකස් කරන්න. කොටුවක් තුළ තොරතුරු දැක්විය යුතු අවස්ථාවල දී අදාළ කොටුව තුළ "X" ලකුණ යොදන්න.

3.0 අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීම සඳහා එක් එක් පාඨමාලා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය පිළියෙල කරන පරිගණක නාමාවලි සකස් කරන්නේ පළමු පිටුවේ දැක්වෙන 1.0-9.5 දක්වා තොරතුරු පදනම් කරගෙන බව කරුණාවෙන් සළකන්න. විශේෂයෙන් ම පාඨමාලාවේ අංකය, 6.2.1 ඡේදය අනුව දිස්ත්‍රික්කය, අ.පො.ස (උ.පෙළ) විභාග අංකය, Z අගය නිවැරදි බවට තහවුරු කරගන්න. අංක එක උඩ එක ලිවීමෙන් හෝ නොපැහැදිලිව ලිවීමෙන්, වැරදි ලෙස ලිවීමෙන් ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව කරුණාවෙන් සළකන්න.

4.0 ශාරීරික අධ්‍යාපනය පාඨමාලාව සඳහා ඉල්ලුම්පත්‍රයේ 12.0 ඡේදය ද, බුද්ධ ධර්මය පාඨමාලාව සඳහා ඉල්ලුම්පත්‍රයේ 13.0 ඡේදය ද, කතෝලික/ක්‍රිස්තියානි ධර්මය පාඨමාලාව සඳහා ඉල්ලුම්පත්‍රයේ 14.0 ඡේදය ද, හින්දු ධර්මය/ඉස්ලාම් ධර්මය පාඨමාලාව සඳහා ඉල්ලුම්පත්‍රයේ 15.0 ඡේදය ද, තාක්ෂණ අධ්‍යයනය - ශිල්ප කලා, නිර්මාණකරණය හා තාක්‍ෂණවේදය යන පාඨමාලා සඳහා ඉල්ලුම්පත්‍රයේ 16.0 ඡේදය ද, බටහිර සංගීතය සඳහා ඉල්ලුම්පත්‍රයේ 17.0 ඡේදය ද, දක්වා ඇති තොරතුරු සැළකිල්ලට ගැනේ. ඒ නිසා ඒවා නිවැරදිව පිරවිය යුතුයි. ඒවා පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

5.0 6.2. ඡේදයට අදාළ වන දිස්ත්‍රික්කවලට නියමිත අංක මෙසේය :

| | | | | | |
|---|---|---|---|---|---|
| කොළඹ | 01 | හම්බන්තොට | 09 | අම්පාර | 17 |
| ගම්පහ | 02 | යාපනය | 10 | පුත්තලම | 18 |
| කළුතර | 03 | කිලිනොච්චිය | 11 | කුරුණෑගල | 19 |
| මාතලේ | 04 | මන්නාරම | 12 | අනුරාධපුරය | 20 |
| මහනුවර | 05 | මුලතිව් | 13 | පොළොන්නරුව | 21 |
| නුවරඑළිය | 06 | වවුනියාව | 14 | බදුල්ල | 22 |
| ගාල්ල | 07 | ත්‍රිකුණාමලය | 15 | මොණරාගල | 23 |
| මාතර | 08 | මඩකලපුව | 16 | කෑගල්ල | 24 |
| | | | | රත්නපුර | 25 |

6.0 මාධ්‍ය සඳහා අදාළ සංකේත මෙසේය : සිංහල - S, දෙමළ - T ඉංග්‍රීසි - E.

7.0 ඉංග්‍රීසි (පාඨමාලා අංකය 11) සහ තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය (පාඨමාලා අංකය 25) පාඨමාලාවලට අයදුම්කරන අයදුම්කරුවන් අයදුම්පත්‍රයේ 1.0 ඡේදයේ විභාගයට පෙනී සිටින නගර අංකය ලෙස සඳහන් කළ යුතු විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංකය පහත දැක්වේ. :—

| | | | | | |
|---|---|---|---|---|---|
| කොළඹ | 01 | තංගල්ල | 09 | අම්පාර | 17 |
| ගම්පහ | 02 | යාපනය | 10 | හලාවත | 18 |
| කළුතර | 03 | කිලිනොච්චිය | 11 | කුරුණෑගල | 19 |
| මාතලේ | 04 | මන්නාරම | 12 | අනුරාධපුරය | 20 |
| මහනුවර | 05 | මුලතිව් | 13 | පොළොන්නරුව | 21 |
| නුවරඑළිය | 06 | වවුනියාව | 14 | බදුල්ල | 22 |
| ගාල්ල | 07 | ත්‍රිකුණාමලය | 15 | මොණරාගල | 23 |
| මාතර | 08 | මඩකලපුව | 16 | කෑගල්ල | 24 |
| | | | | රත්නපුර | 25 |

අදාළ දිස්ත්‍රික්කය තුළ විභාග මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති නම් ආසන්නතම ප්‍රධාන නගරයේ පිහිටුවන විභාග මධ්‍යස්ථානය වෙත එම අයදුම්කරුවන් යොමු කරවීමට කටයුතු කරනු ලැබේ.

*ආදර්ශ අයදුම්පත්‍රය*

***ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත්කර ගැනීම - 2014***

(ගැසට් නිවේදනයේ 10.2 ඡේදයෙහි සඳහන් පරිදි අයදුම්කරුවන් විසින් තම අයදුම්පත ඉදිරිපත් කළ යුතු ය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන ලෙස සකස්කළ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රයේ 9 වැනි ඡේදය දක්වා තොරතුරු පළමු පිටුවට ඇතුළත් කරන්න. තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා පරිගණක නාමාවලිය සකස් කරන්නේ 1.0-9.5 දක්වා තොරතුරු ඇසුරෙණි)

1.0

| *මනාපය* | *පාඨමාලා අංකය* | *ජා. අ. වි. පීඨයේ අංකය* | *පාඨමාලාවේ මාධ්‍යය* S/T/E | *පාඨමාලා අංක (25) විභාගයට පෙනී සිටින මාධ්‍යය* S/T/E | *11/25 විභාගයට පෙනී සිටින නගර අංකය* |
|---|---|---|---|---|---|
| 1<br>2<br>3 | | | | | |

2.0 2.1 මුලකුරු සමග නම ඉංග්‍රීසියෙන් (In Block Letters) නිදසුන : Mr. PERERA R. C.
Mr./Miss :————.

2.2 සම්පූර්ණ නම ඉංග්‍රීසියෙන් : (In Block Letters) :————.

3.0 ස්ථිර පදිංචි ලිපිනය ඉංග්‍රීසියෙන් : (In Block Letters) :————.

දුරකථන අංකය :————.

4.0 ගැසට් නිවේදනයේ 6.2.1 ඡේදයට අනුව දිස්ත්‍රික්කය :————. දිස්ත්‍රික් අංකය : ☐

5.0 5.1 උපන් දිනය :

අවුරුද්ද : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

5.2 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

6.0 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ [1] ස්ත්‍රී [2]

7.0 ජන වර්ගය :

සිංහල [1] ශ්‍රී ලංකා ද්‍රවිඩ [2] ඉන්දියානු සම්භවයක් සහිත ද්‍රවිඩ [3] මුස්ලිම් [4] වෙනත් [5]

8.0 2012 වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල : ☐ (1 . නව නිර්දේශය/2. පැරණි නිර්දේශය)

8.1 වර්ෂය : ☐☐☐☐ විභාගයට පෙනී සිටි මාධ්‍යය :————.

8.2 විභාග අංකය : ☐☐☐☐☐☐☐☐ විභාගයට පෙනී සිටි වාරය :————.

8.3 Z අගය : ☐ . ☐☐☐☐ Z අගය සෘණ නම් අදාළ කොටුවේ M අක්ෂරය යොදන්න ☐

8.4 ප්‍රතිඵල විස්තරය විෂයය අනුව :

| *විෂයය* | *විෂයය අංකය* | *ලැබූ ශ්‍රේණිය* |
|---|---|---|
| 1. ............................................... | ........................ | ........................ |
| 2. ............................................... | ........................ | ........................ |
| 3. ............................................... | ........................ | ........................ |

9.0 9.1 ඉංග්‍රීසි සහ ඉංග්‍රීසි මාධ්‍යය පාඨමාලාවල අයදුම්කරුවන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට හෝ ඉංග්‍රීසි සාහිත්‍යයට ලැබූ ඉහළම ශ්‍රේණිය : [ ] විෂයය අංකය : [ | ]

විභාග අංකය : [ | | | | | | | ] වර්ෂය : [ | | | ]

9.2 ඔබ ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අයදුම්කරන්නේ ද ? ඔව් [1] නැත [2]

9.3 එසේ නම් වතු සේවක දරුවෙක් ද ? නැද්ද යන වග (අදාළ කොටුවේ X ලකුණෙන් දැක්විය යුතුයි.)

ඔව් [1] නැත [2]

9.4 ශාරීරික අධ්‍යාපනය සිංහල/දෙමළ අයදුම්කරුවන් තම අයදුම්පතෙහි 12.0 වගන්තිය සඳහා ඇතුළත් කරනු ලබන ලකුණුවල එකතුව : [ ]

9.5 9.5.1. දෙවන බස (සිංහල) පාඨමාලාව සඳහා අයදුම්කරන අයදුම්කරුවන් අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී දෙවන බස (දෙමළ) භාෂාවට ලැබූ ඉහළම ශ්‍රේණිය : [ ]

විෂයය අංකය : [ | ]

9.5.2 දෙවන බස (දෙමළ) පාඨමාලාව සඳහා අයදුම්කරන අයදුම්කරුවන් අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී දෙවන බස (සිංහල) භාෂාවට ලැබූ ඉහළම ශ්‍රේණිය : [ ]

විෂයය අංකය : [ | ]

10.0 2012 වර්ෂයට පෙර ඔබ අ.පො.ස (උ.පෙළ) විභාගයට පෙනී සිට ඇත්නම් ඔබ පෙනී සිටියේ එක් විෂයයකට පමණක් වුව ද එක් එක් වාරයේ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.

| | | | |
|---|---|---|---|
| 10.1 | විභාගයට පෙනී සිටි වාරය : | 1 | 2 |
| 10.2 | වර්ෂය : | .................. | .................. |
| 10.3 | විභාග අංකය : | .................. | .................. |
| 10.4 | විභාග මධ්‍යස්ථානයේ අංකය : | .................. | .................. |
| 10.5 | Z අගය : | .................. | .................. |
| 10.6 | සමත් වූ විෂයයන් හා ශ්‍රේණි : | | |

| (1 වාරය) | | (2 වාරය) | |
|---|---|---|---|
| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
| .................. | .................. | .................. | .................. |
| .................. | .................. | .................. | .................. |
| .................. | .................. | .................. | .................. |

11.0 සමත් වූ අ.පො.ස (සා.පෙළ) පිළිබඳ විස්තර :

| | | | | |
|---|---|---|---|---|
| 11.1 | විභාගයට පෙනී සිටි වාරය : | 1 | 2 | 3 |
| 11.2 | වර්ෂය : | .................. | .................. | .................. |
| 11.3 | විභාග අංකය : | .................. | .................. | .................. |
| 11.4 | විභාග මධ්‍යස්ථානයේ අංකය : | .................. | .................. | .................. |

11.5 සමත් වූ විෂයයන් හා ශ්‍රේණි :

| | *(1 වාරය)* | | *(2 වාරය)* | | *(3 වාරය)* | |
|---|---|---|---|---|---|---|
| | *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
| 1. | ......................... | ........................ | ........................ | ........................ | ........................ | ........................ |
| 2. | ......................... | ........................ | ........................ | ........................ | ........................ | ........................ |
| 3. | ......................... | ........................ | ........................ | ........................ | ........................ | ........................ |
| 4. | ......................... | ........................ | ........................ | ........................ | ........................ | ........................ |
| 5. | ......................... | ........................ | ........................ | ........................ | ........................ | ........................ |
| 6. | ......................... | ........................ | ........................ | ........................ | ........................ | ........................ |
| 7. | ......................... | ........................ | ........................ | ........................ | ........................ | ........................ |
| 8. | ......................... | ........................ | ........................ | ........................ | ........................ | ........................ |

12.0 *ගැසට් නිවේදනයේ* 4.20 ඡේදයේ 4.20.3 හා 4.20.4 වගන්තියට අනුව ක්‍රීඩා ප්‍රවීණතාව පිළිබඳ විස්තර :

(ශාරීරික අධ්‍යාපන පාඨමාලාවට අයැදුම්කරන අය පමණක් පිරවිය යුතු ය.) මෙම කොටස සම්පූර්ණ කිරීමේ දී 4.20.3 හි සියළු වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කළ යුතු ය. ඔබ ලබා ඇති ඉහළම ක්‍රීඩා සහතික/නිපුණතා තුනක තොරතුරු පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ. ඔබ අ.පො.ස (සා.පෙළ) විභාගයේ සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂයයට පෙනී සිට සාමාර්ථ ලබා ඇත්නම් 4.20.4 ට අනුව ශ්‍රේණියට හිමි ලකුණ ද පහත කොටසෙහි සඳහන් කළ යුතු ය. මුළු ලකුණුවල එකතුව මුල් පිටුවේ 9.4 හි ද ඇතුළත් කළ යුතු ය.

| *අනු. අංකය* | *වර්ෂය* | *නිකුත් කළ අමාත්‍යාංශය/ ආයතනය/ සංගමය* | *තරග නියෝජනය කළ මට්ටම අන්තර්ජාතික/ජාතික/ පළාත්/දිස්ත්‍රික්ක/කලාප* | *ඉසව්ව/ක්‍රීඩාව* | *ලැබූ ස්ථානය* | *4.20.3 ට අදාළ ලකුණු* |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| අ.පො.ස (සා.පෙළ) සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂයයට ලද ශ්‍රේණිය | | | | | ලකුණු | |
| | | | මුළු එකතුව | | | |

13.0 *ගැසට් නිවේදනයේ 4.5 වගන්තියේ (අ) අනුව ප්‍රාචීන ප්‍රාරම්භ, බෞද්ධ ධර්මාචාර්ය, පිරිවෙන් අවසාන, විභාග ප්‍රතිඵල පිළිබඳ විස්තර ඇත්නම් ඇතුළත් කරන්න.*

| *විභාගය* | *ප්‍රාචීන ප්‍රාරම්භ* | *බෞද්ධ ධර්මාචාර්ය* | *පිරිවෙන් අවසාන* | *දහම් පාසල් අවසාන* |
|---|---|---|---|---|
| 13.1 වර්ෂය | | | | |
| 13.2 විභාග අංකය | | | | |
| 13.3 මධ්‍යස්ථාන අංකය | | | | |
| 13.4 විෂයයන් හා ශ්‍රේණි | 1.<br>2.<br>3.<br>4. | 1.<br>2.<br>3.<br>4.<br>5.<br>6. | 1.<br>2.<br>3.<br>4.<br>5.<br>6.<br>7.<br>8.<br>9.<br>10<br>11. | |

14.0 ගැසට් නිවේදනයේ 4.8 ඡේදය අනුව කතෝලික/ක්‍රිස්තියානි ධර්මය අයැදුම්කරුවන් විසින් අදාළ කොටස සම්පූර්ණ කළ යුතු යි.

| පාඨමාලාවේ නම/සහතිකය | හදාරන ලද කාලය | | |
|---|---|---|---|
| | සිට | දක්වා | ලබා ඇති සාමාර්ථය |
| 14.1 දේව ධර්මය පිළිබඳ පාඨමාලාව (BTH) | | | |
| 14.2 ජාතික දෙව්සත්හලේ කිතුනු දර්ශනවාදය පිළිබඳ පාඨමාලා සහතිකය | | | |
| 14.3 ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය මගින් පවත්වනු ලබන කතෝලික දහම් ගුරු සහතිකය | | | |
| 14.4 දේව ධර්ම නිකේතනය මගින් පවත්වනු ලබන කතෝලික ධර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය | | | |
| 14.5 පැවිදිවරයෙකු/පැවිදිවරියක වීම සඳහා ආගමික අධ්‍යාපනය සහ පුහුණු පාඨමාලාව (නොවිෂියේට් පාඨමාලාව) සාර්ථකව හදාරා අවසන් කළ බවට පැවිදි නිකේතනයේ ශ්‍රේෂ්ඨාධිපති/ශ්‍රේෂ්ඨාධිපතිනිය හෝ අදාළ රදගුරුතුමා විසින් නිකුත් කරන ලද සහතිකය | | | |
| 14.6 ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය මගින් පවත්වනු ලබන ආගමික දැනුම පිළිබඳ ජාතික සහතිකය (ධර්මාචාර්ය) ලබා තිබීම | | | |
| 14.7 පිළිමතලාව ලංකා දේව ධර්ම ශාස්ත්‍රාලය මගින් පවත්වනු ලබන ධර්මවේදී ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම | | | |
| 14.8 කතෝලික/ක්‍රිස්තියානි ගුරුවරයකු වීමට සුදුසු බවට කතෝලිකයින් සඳහා කතෝලික රදගුරු පදවි සහතිකය/ක්‍රිස්තියානිකයින් සඳහා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ සහතිකය | | | |
| 14.9 අ. පො. ස. (උසස් පෙළ) ක්‍රිස්තු ධර්මය/ක්‍රිස්තියානි ධර්මය/ක්‍රිස්තියානි ශිෂ්ඨාචාරය විෂයය සමත්වීම | | | |

15.0 ගැසට් නිවේදනයේ 4.6 සහ 4.7 සඳහා හින්දු ධර්මය/ඉස්ලාම් ධර්මය, අයැදුම්කරුවන් විසින් පහත කොටස සම්පූර්ණ කළ යුතු යි.

| පාඨමාලාවේ නම | කාලසීමාව | සහතිකය වලංගු දිනය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

16.0 ගැසට් නිවේදනයේ 4.23/4.24 පාඨමාලාව අයැදුම්කරන්නන් විසින් පහත කොටස සම්පූර්ණ කළ යුතු යි.

16.1 ඉල්ලුම්කරන්නේ ශිල්පකලා/නිර්මාණකරණය හා තාක්‍ෂණවේදය ද යන්න :————.

16.2 ගැසට් නිවේදනයේ 4.23.3/4.24.4 ඡේද අනුව තාක්‍ෂණ අධ්‍යයනය-ශිල්ප කලා/නිර්මාණකරණය හා තාක්‍ෂණවේදය පාඨමාලාවට ඇතුළත් වීමට අපේක්‍ෂිත අයැදුම්කරුවන් රජයේ පිළිගත් ආයතනයකින් ශිල්පීය පාඨමාලාවක් හදාරා නිම කොට තිබේ නම් පහත සඳහන් කොටස සම්පූර්ණ කළ යුතුයි.

| ශිල්පීය පාඨමාලාවේ නම | රජයේ ලියාපදිංචි අංකය හා වලංගු දිනය | පවත්වන ලද ආයතනය | කාල සීමාව | පාඨමාලාව සාර්ථක ලෙස නිමකර තිබේ ද? |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

17.0 *ගැසට් නිවේදනයේ 4.18.1, 4.18.2 ඡේද අනුව බටහිර සංගීතය පාඨමාලාව ඉල්ලුම්කරුවන් සංගීතය පිළිබඳ නිපුණතාවයට අදාළ තොරතුරු ඇතුළත් කළ යුතු ය.*

| *වර්ෂය* | *සහතිකය නිකුත් කළ ආයතනය* | *ප්‍රවීණතාව/සමත් පන්තිය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

18.0 *අයැදුම්කරුගේ ප්‍රකාශය :*

(i) මා විසින් ගැසට් නිවේදනයේ 10.2 ඡේදයෙහි සඳහන් පරිදි අයදුම්පත ඉදිරිපත් කර ඇති බව මම දනිමි.
(ii) මා විසින් අයදුම්පතේ සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු අසත්‍ය හෝ වැරදි බව හෙළිවුවහොත් මා තෝරා ගැනීමට නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව අසත්‍ය හෝ වැරදි බව හෙළි වුවහොත් මාගේ තෝරා ගැනීම අවලංගු වන බවත් මා දනිමි.
(iii) මා විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයැදුම්කර නොමැති බවත්, විශ්වවිද්‍යාලයක/විශ්වවිද්‍යාල විද්‍යායතනයක/වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක ලියාපදිංචි වී නොමැති බවත්/පාඨමාලාවක් හදාරමින් නොසිටින බවත් මෙයින් සහතික කරමි.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

19. ***පාසල්/පිරිවෙන් අපේක්ෂකයන් සම්බන්ධයෙන් විදුහල්පතිගේ/පිරිවෙන් අධිපතිගේ ප්‍රකාශය :***

මෙම අයැදුම්කරු මෙම පාසලේ/පිරිවෙනේ ශිෂ්‍යයකු වශයෙන් අ.පො.ස (සා.පෙළ) විභාගයට හා අ.පො.ස (උ.පෙළ) විභාගයට/ප්‍රාචීන ප්‍රාරම්භ විභාගයට පෙනී සිටි බවත්, අයදුම්කරු විසින් ඉහත දක්වා ඇති විස්තර මාගේ දැනුමේ හැටියට නිවැරදි බවත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති නිල ප්‍රතිඵල සටහන අනුව ........................ වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) විභාගයේ නව/පැරණි නිර්දේශයේ දී අයැදුම්කරු ලබා ගෙන ඇති Z අගය ........................ (අකුරෙන්) ........................ බවත් සහතික කරමි.

————,
විදුහල්පති/පිරිවෙන් අධිපති හිමි ගේ
අත්සන හා නිල මුද්‍රාව.

විදුහල්පති/පිරිවෙන් අධිපති හිමිගේ නම :————.
පාසලේ/පිරිවෙනේ නම හා ලිපිනය :————.
දිනය :————.

20. *පෞද්ගලික අපේක්ෂකයන් සම්බන්ධයෙන් ප්‍රකාශය :*

විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති නිල ප්‍රතිඵල සටහන අනුව ....................... වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) විභාගයේ නව/පැරණි නිර්දේශයේ දී මා ලැබූ Z අගය ..................... (අකුරෙන්) .................... බව සහතික කරමි.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

මා ඉදිරිපිට දී අත්සන් කරන ලදී.

————,
සාමදාන විනිශ්චයකාරතැනගේ අත්සන.

නම :————.

නිල මුද්‍රාව.

දිනය :————.

01-935

**ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය - 2014**

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයට අයත් වෛද්‍ය නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් පැවැත්වීමට කටයුතු යොදා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය කොළඹ දී පැවැත් වේ.

1. ආයුර්වේද කොමසාරිස්තුමා විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

2. ඉල්ලුම්පත්‍ර මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතිවලට අනුකූලව සකස්කර එවිය යුතුය. එම ආදර්ශ ආකෘතිය අනුව ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථාවට අදාළව සුදුසුකම් ලබා ඇති අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කළ යුතු අතර, එම අයදුම්පත්‍රය අපේක්ෂකයින් විසින් සිය ආයතන ප්‍රධානියා මගින් 2014.02.17 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේඛකාධිකාරී, විභාග අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව, නාවින්න මහරගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් එවනු ලබන ලියුම්කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය - 2014" යනුවෙන් සඳහන් විය යුතුය. අයදුම්පත්‍රය කැඳවන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමුවරට මෙම විභාගයට පෙනී සිටීමට කිසිදු ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතෙකුදු වුවත්, ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් එකවර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් රු. 200 ක් වටිනා මුද්දර ද, එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු. 50 ක් බැගින් වටිනා මුද්දර ද අයදුම්පතෙහි අලවා තම අත්සන හා දිනය යොදා අවලංගු කළ යුතුය. මොනම කරුණක් යටතේ වුවද එම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

3. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :-

අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී සහ පෙනී සිටින සෑම විෂයයක් පාසාම ආයුර්වේද දෙපාර්තමේන්තුව සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතරින් කුමක් වුවත් භාර ගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

4. අයදුම්පත් පිළිගන්නා ලද නිලධාරීන් වෙත ආයුර්වේද කොමසාරිස් විසින් විභාග කාලසටහන සහ ප්‍රවේශ පත්‍රය නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් අත්සන නියමිත පරිදි සහතික කරවා ගන්නා ලද ප්‍රවේශ පත්‍රය ආයුර්වේද දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශපත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. යම්කිසි නිලධාරියෙකුට විභාගය පැවැත්වීමට අඩු වශයෙන් දින හතකට පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත් ප්‍රවේශ පත්‍ර නොලැබුණ බව පහත සඳහන් විස්තර සමග "ලේඛකාධිකාරී, විභාග අංශය, ආයුර්වේද දෙපාර්තමේන්තුව, නාවින්න මහරගම" යන ලිපිනයට වහාම දැන්විය යුතුය.

(i) විභාගයේ නම :
(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම :
(iii) අයදුම්කරුගේ ලිපිනය :
(iv) අයදුම්පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලයේ නම සහ ලියාපදිංචි කුවිතාන්සියේ අංකය හා දිනය :

5. විභාග පරිපාටිය
(ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයට අයත් සේවා ව්‍යවස්ථාවට අනුකූලව)

I. මුදල් රෙගුලාසි - පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්
(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ i වැනි කාණ්ඩය (10 පරිච්ඡේදය හැර)

II. *ආයතන සංග්‍රහය* - පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ පළමුවෙනි කාණ්ඩයේ I, II, III, iv, v, vi vii viii xii, xiii, xiv, xxiii, xxvii, xxix, xxx, xxxii, පරිච්ඡේද සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහය පිළිබඳ දැනුම,

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ දෙවෙනි කාණ්ඩයේ xLvii සහ xLviii පරිච්ඡේද,

III. ආරෝග්‍යශාලා පරිපාලනය - පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්

(i) ආරෝග්‍යශාලා පිළිබඳ පැවැත්වෙන සාමාන්‍ය නීති රීති
(ii) ආරෝග්‍යශාලාව පිරිසිදුව තබා ගැනීම
(iii) රෝගීන් සම්බන්ධව බලපැවැත්වෙන නීති රීති
(iv) රෝගීන්ට නියමිත ආහාර පාන ලබා ගන්නා විධි
(v) ඖෂධ නිෂ්පාදනාගාර පාලනය
(vi) රෝගීන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් බලපැවැත්වෙන නීති රීති
(vii) ආරෝග්‍යශාලාවල වෛද්‍ය අධිකාරිගේ සිට අනෙකුත් කණිෂ්ඨ සේවකයින් දක්වා ඔවුන්ට අයත් රාජකාරි පිළිබඳව ඇති අවබෝධය
(viii) ආරෝග්‍යශාලාවල සාමාන්‍ය පාලන කටයුතු
(xi) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පාලන රෙගුලාසි
(x) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ගබඩා ගිණුම් පිළිබඳ නීතිරීති
(xi) ආයුර්වේද කාර්ය සංවිධාන සංග්‍රහය

IV. රාජ්‍ය භාෂා වාචික පරීක්ෂණය - සිංහල/දෙමළ (විනාඩි 15)

(i) සිංහල භාෂා මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධරයන් සඳහා
(අ) දෙමළ භාෂාවෙන් අසන ප්‍රශ්නවලට දෙමළ භාෂාවෙන් පිළිතුරු දීම
(ආ) දෙමළ භාෂාවෙන් අසන වාක්‍ය සිංහල භාෂාවෙන් ප්‍රකාශ කිරීම
(ඇ) සිංහල භාෂාවෙන් අසන වාක්‍ය දෙමළ භාෂාවෙන් ප්‍රකාශ කිරීම

(ii) දෙමළ භාෂා මාධ්‍යයෙන් සේවයට බැඳුණු නිලධරයන් සඳහා
(අ) සිංහල භාෂාවෙන් අසන ප්‍රශ්නවලට සිංහල භාෂාවෙන් පිළිතුරු දීම
(ආ) සිංහල භාෂාවෙන් අසන වාක්‍ය දෙමළ භාෂාවෙන් ප්‍රකාශ කිරීම
(ඇ) දෙමළ භාෂාවෙන් අසන වාක්‍ය සිංහල භාෂාවෙන් ප්‍රකාශ කිරීම.

විභාගය සමත් වීම සඳහා එක් එක් විෂයට අවම වශයෙන් ලකුණු 40 ක් ලබා ගත යුතුය.

පී. එස්. කේ. ආර්. වීරකෝන්,
ආයුර්වේද කොමසාරිස්,
ආයුර්වේද දෙපාර්තමේන්තුව.

2014 ජනවාරි මස 13 වැනි දින,
ආයුර්වේද දෙපාර්තමේන්තුව,
නාවින්න, මහරගම.

ආදර්ශ අයදුම්පත්‍රය

**ආයුර්වේද වෛද්‍ය සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014**

විභාග අංකය :

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

විභාගයට පෙනී සිටින මාධ්‍යය :

(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

සිංහල - S දෙමළ - T

01. මුලකුරු සමග නම (Mr/Mrs/Miss) :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

02. මුලකුරු සමග නම :————. මයා./මිය./මෙනවිය
(සිංහලෙන්/දෙමළෙන්)

03. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

04. මුලකුරු වලින් හැඳින්වෙන නම් :————.
(සිංහලෙන්/දෙමළෙන්)

05. ජාතික හැඳුනුම්පත් අංකය :

06. (i) සේවා ස්ථානය හා ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ii) සේවා ස්ථානය අයත් පළාත :————.

07. (i) සේවා ස්ථානය හා ලිපිනය :————.
(සිංහලෙන් හෝ දෙමළෙන්)

(ii) දුරකථන අංකය :————.

08. (i) දැනට දරන තනතුර :————.
(ii) පත්වීම් ලිපියේ අංකය හා දිනය :————.

09. ඔබ දැන් ඉදිරිපත් වන විෂය/විෂයයන් :

| අනු. අංකය | විෂයය | විෂයය අංකය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

10. ඔබ මින් ඉහත විභාගයක දී පහත සඳහන් විෂයයන් එකකින් හෝ කිහිපයක් හෝ සමත් වී තිබේද? මුදල් රෙගුලාසි/ආයතන සංග්‍රහය/ආරෝග්‍යශාලා පරිපාලනය/වාචික පරීක්ෂණය (දෙමළ/සිංහල) එසේ නම් විභාග අංකය සහ දිනය සඳහන් කරන්න. :

| විෂයය | විභාග අංකය | වර්ෂය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

11. ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.
විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් අලවන ලද මුද්දරවල වටිනාකම :————.

මුද්දර කොටුව :

සම්පූර්ණ විභාගය සඳහා රු. 200 ක් වටිනා මුද්දර ද, එක් එක් විෂයයක් සඳහා නම් රු. 50 බැගින් වටිනා මුද්දර ද මෙහි අලවන්න.

**සංලක්ෂ්‍යය** :- අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් නියමිත වටිනාකමින් යුත් මුද්දර ඔහුගේ/ඇයගේ අත්සන සහ දිනය යොදා අවලංගු කළ යුතුයි. මුද්දර එකපිට එක නොඇලවිය යුතුයි.

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. මෙහි අලවා ඇති රු. …… ක මුද්දර පාවිච්චි නොකරන ලද වලංගු ඒවා බවත් සහතික කරමි. මෙම විභාගය සඳහා පනවා ඇති නීති රීති පිළිබඳව මම එකඟ වෙමි.

————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

සටහන.—තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්මේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

*අත්සන සහතික කිරීම*

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ……………………………… මහතා/ මහත්මිය/මෙනවිය ………… වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

01-928

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.